# දෙවැනි කොටස


| | පිටුව |
|---|---|
| මහ බැංකුවේ ගිණුම් හා කටයුතු | I-XLIV |
| කාර්ය මණ්ඩල පුවත් | XLIV-XLVII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
|---|---|
| ගිණුම් හා බැංකු කටයුතු | I |
| ව්‍යවහාර මුදල් නිකුතුව | IX |
| බැංකු සංවර්ධන | X |
| බැංකු අධීක්ෂණ | XII |
| බැංකු නොවන මූල්‍ය ආයතන | XIV |
| සංවර්ධන මුදල් | XVI |
| ග්‍රාමීය ණය | XXVI |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | XXVIII |
| ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය | XXXI |
| සේවක අර්ථ සාධක අරමුදල | XXXI |
| විනිමය පාලන | XXXIII |
| රාජ්‍ය ණය | XXXVI |
| ප්‍රාදේශීය කාර්යාල - මාතර අනුරාධපුරය සහ මාතලේ | XXXVII |
| ප්‍රවෘත්ති හා ප්‍රකාශන | XXXIX |
| පර්යේෂණ කටයුතු | XL |
| සමීක්ෂණ හා දත්ත රැස්කිරීම | XL |
| දත්ත සැකසුම් | XLII |
| පුහුණු කිරීම් | XLII |
| කළමනාකාරිත්ව විගණන | XLII |
| පරිශ්‍ර | XLIII |
| සුබසාධන | XLIV |
| කාර්ය මණ්ඩල පුවත් | XLIV |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1992 වර්ෂය අවසාන වන විට මහ බැංකුවේ මුළු වත්කම් / වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 101,254 ක් විය. මෙය ඉකුත් වසර හා සසඳන විට සියයට 5.7 ක වැඩිවීමකි. 1992 දෙසැම්බර් 31 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා ලාභ අලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

වත්කම් අංශය සලකන විට මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය සියයට 38.4 කින් වැඩි වූ අතර දේශීය වත්කම් සහ අනෙකුත් වත්කම් හා ගිණුම් පිළිවෙලින් සියයට 9.5 කින් සහ සියයට 4.3 කින් අඩු විය. දේශීය වත්කම් අතර, රජයේ සහ රජයේ සහතික කළ සුරැකුම් පත් සියයට 27 ක විශාලතම අඩුවීම වාර්තා කළේ ය. එසේ වුව ද රජයට සපයන ලද ණය සහ අත්තිකාරම් සියයට 16.7 කින් වැඩි වූ අතර වාණිජ බැංකු සහ අනෙකුත් ණයදෙන ආයතනවලට සපයන ලද මැදි හා දිගු කාලීන ණය පහසුකම් සියයට 22.5 කින් වැඩි විය. මේ අතර පසුගිය වර්ෂය හා සැසැදීමේදී වාණිජ බැංකුවලට දෙන ලද කෙටි කාලීන අත්තිකාරම් සියයට 33.9 ක අඩුවීමක් වාර්තා කළේ ය.

වගකීම් අංශය සලකන විට පසුගිය වර්ෂයේ ලාභයෙන් රුපියල් දශලක්ෂ 143 ක් අතිරික්ත ගිණුමට මාරු කිරීම නිසා ප්‍රාග්ධන ගිණුම සියයට 16.7 ක වැඩිවීමක් පෙන්නුම් කළේ ය. මුළු වගකීම්වල විශාලතම තනි අංශය වන සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් ප්‍රමාණය පසුගිය වර්ෂයට වඩා සියයට 10.8 ක වැඩිවීමක් දැක්විය. මහ බැංකුව වෙතැති මුළු තැන්පතු ප්‍රමාණය සියයට 1.5 ක වැඩිවීමක් පෙන්වීය. සමාලෝචනයට භාජනය වී ඇති වර්ෂය තුළ දී රජයේ තැන්පතු සියයට 70.6 කින් සහ රජයේ නියෝජිතායතනවල තැන්පතු සියයට 66.5 කින් අඩු විය. මේ අතර ජාත්‍යන්තර සංවිධාන, විදේශ රජයන් සහ විදේශ බැංකු ආයතනවල තැන්පතු සියයට 37 කින් වැඩිවූ අතර වානිජ බැංකු තැන්පතු සියයට 15.3 කින් වැඩි විය. මැදි සහ දිගු කාලීන ණය අරමුදලෙහි සම්පත්වල සියයට 23.1 ක වැඩිවීමක් වාර්තා විය. මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල ප්‍රධාන සංයුතික අංශයන් හි සැසඳීමක් අංක 2.2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1992 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 12,070 ක්වූ මහ බැංකුවේ ආදායම පසුගිය වර්ෂය හා සසඳීමේදි සියයට 34.8 ක වැඩිවීමක් පෙන්නුම් කළේ ය. වියදම් සහ සංචිත ගිණුමට කරන ලද වෙන් කිරීම් ද, ක්ෂයවීම් හා අනෙකුත් ගෙවීම් ද වෙන් කළ පසු අදාළ වර්ෂය සඳහා මහ බැංකුවේ ශුද්ධ ලාභය වූ රුපියල් දශලක්ෂ 1,000 මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තියට අනුව රජයේ ඒකාබද්ධ අරමුදලට ගෙවීම සඳහා වෙන් කෙරුණි.

## විදේශ විනිමය කටයුතු

වාණිජ බැංකු සමග කෙරෙන විදේශ විනිමය ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරය සඳහා වූ එතැන් ගැනුම් හා විකුණුම් මිළ තීරණය කිරීම තවදුරටත් මහ බැංකුව විසින් කර ගෙන යන ලදී. මෙරට විදේශ විනිමය මුදල් වෙළෙඳපල කටයුතු වැඩි දියුණු කිරීමේ අදහසින් පුළුල් ආන්තිකයන් සහිතව විදේශ විනිමය මිලදී ගැනීමේ හා විකිණීමේ අනුපාතිකයන් ප්‍රකාශයට පත්කිරීම 1992 මාර්තු මස සිට මහ බැංකුව ආරම්භ කළේය.

පෙර මෙන් මහ බැංකුව විසින් සිය විදේශ විනිමය සංචිත, ජාත්‍යන්තර මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳපල වල ආයෝජනය කිරීම තවදුරටත් කර ගෙන යන ලදී.

1991.12.31 වැනි දින හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ

## වගකීම්

| 1991 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1992 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය | 1,50,00,000 | |
| 84,20,00,000 | 85,70,00,000 | අතිරික්තය | 98,50,00,000 | 100,00,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා** | | |
| | | ව්‍යවහාර මුදල් | | |
| 2,641,12,40,020 | | නෝට්ටු | 2,927,03,72,778 | |
| 111,13,53,950 | 2,752,25,93,970 | කාසි | 122,58,82,746 | 3,049,62,55,524 |
| | | **තැන්පතු** | | |
| 901,69,71,676 | | රජය | 265,46,14,089 | |
| 10,71,40,735 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන | 3,59,10,658 | |
| 1,242,61,54,793 | | වෙළෙඳ බැංකු | 1,432,56,62,158 | |
| | | ජාත්‍යන්තර සංවිධාන, | | |
| | | විදේශීය රාජ්‍ය හා | | |
| 1,299,42,79,929 | | විදේශීය බැංකු ආයතන | 1,782,72,14,959 | |
| | | භාණ්ඩාගාර බිල්පත්වල | | |
| | | ආයෝජනය කළ | | |
| | | රු. 2,26,00,033/- හැර | | |
| | | අනිවාර්ය ඉතිරිකිරීමේ | | |
| 3,46,094 | | අරමුදල | 5,38,427 | |
| 70,40,12,736 | 3,524,89,05,963 | අනෙකුත් | 92,11,95,999 | 3,576,51,36,290 |
| | | මධ්‍යම හා දීර්ඝ කාලීන | | |
| | 400,00,00,000 | ණය අරමුදල | | 492,50,00,000 |
| | 50,77,50,000 | ප්‍රාග්ධන දායක දීමනා ගිණුම | | 53,77,50,000 |
| | 2,769,87,65,231 | අනෙකුත් වගකීම් හා ගිණුම් | | 2,852,99,36,566 |
| | 9,583,50,15,164 | | | 10,125,40,78,380 |

## 1992 දෙසැම්බර් මස 31 වැනි දිනෙන්

| 1991 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1992 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 765,82,14,373 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නීති පණතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන්කිරීම්. | | 1,107,03,37,959 |
| | | **වර්ෂයේ ශුද්ධ ලාභය** | | |
| 14,30,00,000 | | මුදල් නීති පණතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් යොදා ගන්නා ලදී. | | |
| 115,00,00,000 | 129,30,00,000 | මුදල් නීති පණතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට | 100,00,00,000 | 100,00,00,000 |
| | 895,12,14,373 | | | 1,207,03,37,959 |

එච්. බී. දිසානායක
අධිපති

එම්. බී. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී

1992.12.31 වැනි දිනවල
ශේෂ පත්‍රයත් සැසඳීම

2.1 සංඛ්‍යා සටහන

## වත්කම්

| 1991 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1992 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 2,131,82,00,937 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් | 1,022,93,41,245 | |
| 733,17,28,788 | | විදේශීය සුරැකුම්පත් සහ භාණ්ඩාගාර බිල්පත් | 2,943,01,57,174* | |
| 1,00,03,786 | 2,865,99,33,511 | විශේෂ ආපසු ගැනීම් හිමිකම්පත් | 32,22,160 | 3,966,27,20,579 |
| | | **දේශීය වත්කම්** | | |
| 1,611,73,13,293 | | ණය සහ අත්තිකාරම් රජයට | 1,880,18,31,081 | |
| | | අනෙකුත් අයට - මධ්‍යම | | |
| 394,98,28,378 | | හා දීර්ඝ කාලීන | 483,95,48,302** | |
| 139,42,48,551 | | කෙටි කාලීන | 92,32,65,218 | |
| 2,986,39,52,320 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් | 2,180,20,50,273 | |
| 50,77,50,000 | 5,183,30,92,542 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දායක දීමනා | 53,77,50,000 | 4,690,44,44,874 |
| | 1,534,19,89,111 | අනෙකුත් වත්කම් හා ගිණුම් | | 1,468,69,12,927 |
| | 9,583,50,15,164 | | | 10,125,40,78,380 |

* 1964 පෙබරවාරි මස 01 දින රු. 55,27,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697/- ක් සහ රු. 34,340/- විය.

** රු. දශලක්ෂ 100.0 ක විශේෂ ණය මුදල ඇතුළත් වෙයි.

## අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම

| 1991 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | | 1992 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 895,12,14,373 | පොලී ආදිය | | 1,207,03,37,959 |
| | 895,12,14,373 | | | 1,207,03,37,959 |

විගණකාධිපති සටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1992 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංකः 38 දරන මුදල්පණතේ 13(1) වගන්තිය සහ 1949 අංකः 58 දරන මුදල් නීති පණතේ 42(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

එකී මුදල් නීති පණතේ 42(2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

කොළඹ 7.

විගණකාධිපති කාර්යාලයේදිය

1993 අප්‍රේල් මස 07 වැනි දින දිය.

එස්. එම්. සබ්රි

විගණකාධිපති.

## 2.2 සංඛ්‍යා සටහන

## 1991 හා 1992 මුදල් වර්ෂයන්ගේ අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල වූ ප්‍රධාන අයිතමයන් සැසඳීම

| | වගකීම් | | | | | වත්කම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අයිතමය | 1991 | | 1992 | | අයිතමය | 1991 | | 1992 | |
| | රුපියල් දශලක්ෂ | % | රුපියල් දශලක්ෂ | % | | රුපියල් දශලක්ෂ | % | රුපියල් දශලක්ෂ | % |
| ප්‍රාග්ධන ගිණුම | 857.0 | 0.9 | 1,000.0 | 1.0 | ජාත්‍යන්තර සංචිතය | 28,659.9 | 29.9 | 39,662.7 | 39.2 |
| සංසරණයේ පවත්නා ව්‍යවහාර මුදල් | 27,522.6 | 28.7 | 30,496.3 | 30.1 | | | | | |
| තැන්පතු | 35,248.9 | 36.8 | 35,765.1 | 35.3 | දේශීය වත්කම් | 51,833.1 | 54.1 | 46,904.5 | 46.3 |
| මධ්‍යම හා දිගු කාලීන ණය | 4,000.0 | 4.2 | 4,925.0 | 4.9 | අනෙකුත් වත්කම් | 15,342.0 | 16.0 | 14,686.9 | 14.5 |
| ප්‍රාග්ධන දායක දීමනා ගිණුම | 507.7 | 0.5 | 537.8 | 0.5 | | | | | |
| අනෙකුත් වගකීම් | 27,698.8 | 28.9 | 28,529.9 | 28.2 | | | | | |
| එකතුව | 95,835.0 | 100.0 | 101,254.1 | 100.0 | එකතුව | 95,835.0 | 100.0 | 101,254.1 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා බැංකුව.

## රන් අලෙවිය

සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළ දී වෙළෙඳ හා විනිමය පාලන කටයුතු තවදුරටත් ලිහිල් කිරීම සමඟ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඇතුළත රන් අලෙවි කටයුතු ආරම්භ කිරීම සඳහා වාණිජ බැංකුවලට අවසර දීමට තීරණය කරන ලදී. ඒ අනුව ගුවන් තොටුපළෙහි මහ බැංකු විසින් පවත්වාගෙන යන ලද රන් අලෙවි හල් දෙක වසා දැමීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. 1992 සැප්තැම්බර් මස 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මගීන් පිටව යන ස්ථානයෙහි පැවැති රන් අලෙවි හල වසා දැමූ අතර මගීන් පැමිණෙන ස්ථානයෙහි පිහිටි රන් අලෙවි හල 1992 නොවැම්බර් මස 05 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි වසා දමන ලදී. එසේ වුව ද මහ බැංකුවේ මූලස්ථාන පරිශ්‍රයෙහි කර ගෙන යනු ලැබූ රන් අලෙවිය සුපුරුදු පරිදි නොකඩවා පවත්වා ගෙන යන ලදී.

## ආසියානු නිෂ්කාශන සංගමය

ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරුණු ගනුදෙනු ප්‍රමාණයේ මුළු වටිනාකම පසුගිය වසර තුළ වූ රුපියල් දශලක්ෂ 23,906 හා සසඳනවිට 1992 දී රුපියල් දශලක්ෂ 21,806 ක් විය. 1991 වසරේ රුපියල් දශලක්ෂ 8,756 හා සසඳන විට 1992 දී විදේශ මුදල්වලින් සිදු කෙරුණු ශුද්ධ පියවීම්වල රුපියල් වටිනාකම රුපියල් දශලක්ෂ 7,403 ක් විය. ගනුදෙනු ප්‍රමාණයෙහි සහ ශුද්ධ පියවීම්වල වූ මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉන්දියාවෙන් කරන ලද ආනයන සඳහා ආසියානු නිෂ්කාශන සංගමයෙන් බාහිරව ගෙවීම් කිරීමට ආනයනකරුවනට අවසර දීම ය. මෙම තීරණය ගන්නා ලද්දේ 1992 දී ඉන්දියාව විසින් හඳුන්වා දෙන ලද ලිහිල් කළ විනිමය පාලන ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ ආනයනකරුවනට මුහුණ පෑමට සිදු වූ අපහසුකම් මඟ හරවාලීම සඳහා ය. විමසුමට ලක්ව ඇති කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාව මගින් විනිමය හුවමාරු පහසුකම සඳහා වූ දායකත්වය රුපියල් දශලක්ෂ 752 ක් විය.

## මහ බැංකු පොලී අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලින අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් වශයෙන් නොවෙනස් ව පැවතිණ.

## කෙටි කාලීන ණය

අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ (අ.ණ.ප්‍ර.යෝ.), වාණිජ බැංකුවලට ණය පහසුකම් සැපයීමෙහි මහබැංකුව තවදුරටත් නිරත විය. 1991 මාර්තු මස 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙම ක්‍රමයේ කාණ්ඩ i සහ කාණ්ඩ ii සඳහා අදාළ වූ ආන්තිකයන් පිළිවෙලින් වර්ෂයකට සියයට 2 සහ සියයට 2.8 වශයෙන් සියයට එකකින් අඩු කරන ලදී. මේ අතර 1992 දෙසැම්බර් මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කාණ්ඩ i සහ කාණ්ඩ ii යටතේ වූ පොලී අනුපාතිකයන් පිළිවෙලින් වර්ෂයකට සියයට 18 සහ වර්ෂයකට සියයට 15 දක්වා වැඩි කරන ලදී. ඒ සමඟ ම, එම එක් එක් කාණ්ඩ යටතේ වාණිජ බැංකුවලට අවසර දෙන ලද ආන්තිකය වර්ෂයකට සියයට 1.5 දක්වා අඩු කරන ලදී. සංශෝධිත අනුපාතිකයන් සහ කලින් පැවැති අනුපාතිකයන් පහත සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

## 2.3 සංඛ්‍යා සටහන

### අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය (අ.ණ.ප්‍ර.යෝ.) - පොලී අනුපාත

වර්ෂයකට සියයට ගණන

| | පොලී අනුපාතිකය | | වාණිජ බැංකුවලට අවසර දෙන ලද ආන්තික | |
|---|---|---|---|---|
| | සංශෝධනයට පෙර | සංශෝධනයට පසු | සංශෝධනයට පෙර | සංශෝධනයට පසු |
| කාණ්ඩ I | 17 | 18 | 2.0 | 1.5 |
| කාණ්ඩ II | 12 | 15 | 2.8 | 1.5 |

අපනයන ණය ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකුවලට අදාළවන ආවරණයන්, ප්‍රතිමූල්‍ය අනුපාතික සහ සීමාවන් සම්බන්ධයෙන් වෙනස්කම් හඳුන්වා දෙන ලදී. 1992 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පීරූ කොහු කෙඳි සහ කුරුඳු කාණ්ඩ I සිට කාණ්ඩ II ට මාරු කරන ලදී. 1992 පෙබරවාරි මස 3 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කාණ්ඩ I යටතේ වූ අවශේෂ අයිතමයන් සඳහා සපයනු ලබන ප්‍රතිමූල්‍ය ප්‍රමාණය ණයවර ලිපියෙහි හෝ අපනයන ඇණවුමෙහි නැ.වි.ස. වටිනාකමින් සියයට 60 දක්වා වූ උපරිමයකට ප්‍රතිශෝධනය කරන ලදී. එසේ වුවද එම ප්‍රමාණය, වාණිජ බැංකුව විසින් දෙන ලද ණය මුදලේ ප්‍රමාණය නොඉක්මවිය යුතුය. සංශෝධනයට පෙර මෙම කාණ්ඩය සඳහා අදාල වූ ප්‍රතිමූලය ප්‍රමාණය වාණිජ බැංකු විසින් දෙන ලද අදාල ඇසුරුම් ණය මුදලින් සියයට 50 ක් විය. 1992 දෙසැම්බර් මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කාණ්ඩ I යටතේ ඒ ඒ බැංකු සඳහා අදාල වූ ණය සීමාවන් අඩුකරනු ලැබීම නිසා මුළු සීමාව රුපියල් දශලක්ෂ 490 සිට රුපියල් දශලක්ෂ 150 දක්වා පහත වැටුණි. ඒ සමගම, කාණ්ඩ II යටතේ එක් එක් භාණ්ඩ සඳහා එක් එක් අපනයනකරුවනට නියම කර තිබූ රුපියල් දශලක්ෂ 10 ක උපරිම සීමාව ඉවත් කොට ඒ වෙනුවට රුපියල් දශලක්ෂ 200 ක සමස්ථ සීමාවක් ඇතුලත එක් එක් වාණිජ බැංකු සඳහා වෙන් කිරීම් කරන ලදී.

1992 දෙසැම්බර් මස 15 වැනි දින සිට සහතික මිල යෝජනා ක්‍රමය යටතේ සහ අවම මිල යෝජනා ක්‍රමය යටතේ වෙළඳ ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ගබඩා කිරීම සඳහා දෙනු ලබන අත්තිකාරම් සම්බන්ධයෙන් මහබැංකුව අයකරනු ලබන පොලී අනුපාතික වර්ෂයකට සියයට 9 සිට වර්ෂයකට සියයට 11 දක්වා වැඩි කරන ලදී.

වී සහ අනෙකුත් භෝග මිලදී ගැනීම / ගබඩා කිරීම සඳහා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් සිය ගණුදෙනුකරුවනට හෝ ගොවි සංවිධානවලට දෙනු ලබන අත්තිකාරම් සම්බන්ධයෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීමට නව යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. 1992 මාර්තු මස 12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙම යෝජනා ක්‍රමය යටතේ මාස හයක උපරිම කාලපරිච්ඡේදයක් දක්වා ණය පහසුකම් සලසන ලදී. මෙම යෝජනා ක්‍රමය ආරම්භයේදී ප්‍රතිමූල්‍ය අනුපාතිකය සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සඳහා අවසර දෙන ලද ආන්තිකය යන දෙකම සියයට 9 ක් බැගින් නියම කරන ලදී. 1992 දෙසැම්බර් මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිමූල්‍ය අනුපාතිකය සියයට 11 දක්වා වැඩිකරන ලද අතර ආන්තිකය නොවෙනස්ව පැවතුණි.

කුඩා තේ ඉඩම් හිමියන් විසින් තේ කම්හල් වෙත සපයන ලද අමු තේ දළු සඳහා වූ හිඟ මුදල් ගෙවීම සහ තේ කම්හල් හිමියන්ට නිෂ්පාදනය පවත්වාගෙන යාම සඳහා ඔවුන්

අතර බෙදා දීම සඳහා තේ බ්‍රෝකර්වරුන්ගේ සමාගම් හතකට වාණිජ බැංකුවලින් දෙන ලද අත්තිකාරම් සම්බන්ධයෙන් 1992 අප්‍රේල් මස 07 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් විශේෂ ප්‍රතිමූල්‍ය පහසුකමක් හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය අනුපාතිය සහ වාණිජ බැංකුවලට අවසර දෙන ලද ආන්තිකය පිළිවෙලින් සියයට 17 ක් හා සියයට 3 ක් වශයෙන් නියම කරන ලදී. මෙම ප්‍රතිමූල්‍ය ණය සඳහා මුල්කාලසීමාව මාස 6 ක් වූ අතර එබඳු ණය වරකට මාස 6 ක කාලසීමාව නොඉක්මවන පරිදි මාස 18 ක මුළු කාලසීමාවක් දක්වා තව දුරටත් දීර්ඝ කිරීමට ඉඩ සලසන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ 1992 වර්ෂය අවසානය වනවිට නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 258 ක් විය.

### මැදි හා දිගු කාලීන ණය

1992 අවසානයවන විට මැදි හා දිගු කාලීන ණය අරමුදල රුපියල් දශලක්ෂ 4,925 දක්වා රුපියල් දශලක්ෂ 925 කින් වැඩි විය.

මෙම අරමුදල යටතේ වූ සියළුම කාණ්ඩයන් සඳහා අයකරනු ලබන පොලී අනුපාතිකයන් සෑම එකක්ම 1992 දෙසැම්බර් මස 15 වැනි දින සිට සියයට 2 කින් වැඩි කරන ලදී. ඒ සමගම මෙම යෝජනා ක්‍රමයේ කාණ්ඩ 1 සඳහා අදාළ වූ ආන්තිකය සියයට 2 කින් අඩුකරන ලද අතර අනෙකුත් කාණ්ඩය සඳහා වූ අනුපාතිකයන් සියයට 1 බැගින් අඩුකරන ලදී. සංශෝධනය කරන ලද පොලී අනුපාතිකයන් සහ මෙම අරමුදල යටතේ ණයදෙන ආයතනයන්ට අවසර දෙන ලද ආන්තික ද 2.4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

2.4 සංඛ්‍යා සටහන

මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ ප්‍රතිමූල්‍ය ණය සඳහා වූ පොලී අනුපාතික සහ අවසර දෙන ලද ආන්තික

වර්ෂයකට සියයට ගණන

| | පොලී අනුපාත | | ණයදෙන ආයතනවලට අවසර දෙන ලද ආන්තික |
|---|---|---|---|
| | ව්‍යාපෘතියෙහි මුළු වියදම රුපියල් දශලක්ෂ 5ට අඩු | ව්‍යාපෘතියෙහි මුළු වියදම රුපියල් දශලක්ෂ 5 ට වැඩි | |
| කාණ්ඩ I | 13 | 13 | 5 |
| කාණ්ඩ II | 11 | 12 | 3 |
| කාණ්ඩ III | 14 | 14 | 3 |
| කාණ්ඩ IV | 16 | 16 | 3 |

### මූල්‍ය සමාගම් සඳහා පහසුකම්

1988 අංක:78 දරණ මූල්‍ය සමාගම් පණතේ 20(4) සහ 21(1) වගන්ති ප්‍රකාර මූල්‍ය සමාගම් සඳහා ණය පහසුකම් සැලසීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ 1992 දී සපයන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 948 ක් වූ අතර 1992 අවසානය වන විට නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,811 ක් විය.

වාණිජ බැංකු ණය

(අ) ණය සීමා

1992 අගෝස්තු මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි 1989 ජුනි 15 වැනි දින සිට ක්‍රියාත්මකව පැවති ණය සීමා ඉවත් කරන ලදී.

(ආ) ණයවර ලිපි සඳහා වූ ආන්තික අවශ්‍යතා

1992අගෝස්තු 13 වැනි දින සිට පැවැත්වෙන පරිදි 1989 ජුනි 15 වැනි දින සිට ක්‍රියාත්මක වූ අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ වශයෙන් සැලකෙන භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් වූ සියයට සියයක මුදල් ආන්තිකයන් රඳවා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

සංචිත අවශ්‍යතා

1992 ජනවාරි මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වාණිජ බැංකුවල ඉල්ලුම්, කාලීන සහ ඉතුරුම් තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වර්ෂයකට සියයට 13 සිට වර්ෂයකට සියයට 14 දක්වා වැඩිකරන ලදී. පසුව 1992 සැප්තැම්බර් මස 04 වැනි දින සිට බලපැවැත්වෙන මෙය වර්ෂයකට සියයට 13 දක්වා අඩු කරන ලද අතර විදේශ මුදල් වලින් වූ තැන්පතු වගකීම්ද මෙම සංචිත අවශ්‍යතාවය යටතට ගෙන එන ලදී.

භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීයික වෙළෙඳපොල කටයුතු.

භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීයික වෙළෙඳපොලේ මුළු විකුණුම් පිරිවැටුම 1991 රුපියල් දශලක්ෂ 78,254 සිට 1992 දී රුපියල් දශලක්ෂ 120,798 දක්වා වැඩි විය. විමසුමට ලක්ව ඇති වර්ෂය තුළදී මිලදී ගැනීම් පිරිවැටුමද රුපියල් දශලක්ෂ 37,486 සිට රුපියල් දශලක්ෂ 50,907 දක්වා වැඩි විය. බැංකු නොවන අංශයට අදාළ ශුද්ධ විකුණුම් පිරිවැටුම 1991 රුපියල් දශලක්ෂ 9,658 සිට 1992 දී රුපියල් දශලක්ෂ 20,768 දක්වා වැඩි විය.

විමසුමට ලක්ව ඇති වර්ෂය තුල භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීයික වෙළෙඳ පොලේ කටයුතු වලට අදාල වාර්ෂික වට්ටම් අනුපාතිකය වර්ෂයකට සියයට 14.50 සිට වර්ෂයකට සියයට 17.05 දක්වා වෙනස් විය.

මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහතාධාර හා කරුණා සහගත ගෙවීම.

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධ යෝජනා ක්‍රමය රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

අපනයනකරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන

අපනයනකරුවන්ට ගෙවනලද ආනයන තීරුබදු ප්‍රතිදාන සඳහා වාණිජ බැංකු මගින් ඉදිරිපත් කරන ලද හිමිකම් ප්‍රතිපූර්ණය කිරීම රජය වෙනුවෙන් මහ බැංකුව මගින් තවදුරටත් කරගෙන යන ලදී. මේ යටතේ 1991 දී ප්‍රතිපූර්ණය කරන ලද රුපියල් දශලක්ෂ 556.5 සසඳන විට 1992 වර්ෂයතුලදි රුපියල් දශලක්ෂ 638 ක් ප්‍රතිපූර්ණය කරන ලදී.

### අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල

රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදලේ පාලනය සහ 1971 අංකː 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීම් පණත සහ 1972 අංකː 15 දරණ ආදායම් උපරිම සහ අනිවාර්ය ඉතිරි කිරීම් පණත් යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් මහ බැංකුව තව දුරටත් කටයුතු කරන ලදී. වර්ෂය තුළදී දායකයින් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් 34 ක් සඳහා රුපියල් 47,433.00 ක් (පොලියද ඇතුළුව) ගෙවන ලදී.

### රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුව විසින් රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිතායතන හා ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වා ගෙන යෑම තවදුරටත් කරගෙන යන ලදී. 1992 දෙසැම්බර් අගවන විට ක්‍රියාත්මකව පැවති ගිණුම් සංඛ්‍යාව 182 ක් විය.

### විදේශ මූල්‍ය

රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදාන යටතේ නිකුත් කරන ලද මුදල් ලබා ගැනීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යනු ලැබූ අතර විදේශ ණය ආපසු ගෙවීම් ද කරනු ලැබීය.

### මූල්‍ය මෙහෙයුම් ඒකකය

බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ පිහිටුවනලද මහ බැංකුවේ හා භාණ්ඩාගාරයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් මූල්‍ය මෙහෙයුම් ඒකකය මහ බැංකුවේ සංචිත මුදල් තත්ත්වය පිළිබඳව විමසිලිමත් වීම දිගටම කරගෙන යන ලදී. විමසුමට ලක්ව ඇති වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් පුරෝකථන කමිටුවේ කාර්යයන්ද මෙම ඒකකය වෙත පවරන ලදී.

### ශ්‍රී ලංකා ස්වයංක්‍රීය චෙක්පත් නිෂ්කාශනාගාරය.

ශ්‍රී ලංකා ස්වයංක්‍රීය චෙක්පත් නිෂ්කාශනාගාරය විසින් අන්තර් බැංකු චෙක්පත් නිෂ්කාශන පහසුකම ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු වලට නොකඩවා සපයන ලදී. 1992 දී ශ්‍රී ලංකා ස්වයංක්‍රීය චෙක්පත් නිෂ්කාශනාගාරයේ දී නිෂ්කාශනය වන දෛනික සාමාන්‍ය චෙක්පත් සංඛ්‍යාව 90,000 දක්වා සියයට 17 කින් වැඩි විය. 1992 දී ක්‍රියාත්මක වූ නිෂ්කාශන වැඩ සටහනට අනුව, මුළු සංඛ්‍යාව 684 ක්වූ වාණිජ බැංකු / ශාඛා වලින්, බැංකු / ශාඛා 220 ක් එක් දින නිශ්කාශන වැඩ සටහන යටතට ගෙනෙන ලදී. ඉතිරියෙන් බැංකු / ශාඛා 54, ක් 211 ක්, සහ 120 ක් පිළිවෙලින් දින 2, දින 3 සහ දින 5 නිෂ්කාශන ලේඛනයන් යටතට ගෙනෙන ලදී. උතුරු නැගෙනහිර සමතයකට පත් නොවූ තත්ත්වයන් නිසා බැංකු / ශාඛා 69 ක් දින 7 ක නිෂ්කාශන ලේඛනය යටතේ පැවැතුනි. ස්වයංක්‍රීය චෙක්පත් නිෂ්කාශන පහසුකම වඩා හොඳින් ප්‍රයෝජනයට ගැනීම සඳහා එයට සහභාගි වන බැංකු උනන්දු කිරීමට, කියවන / තෝරන යන්ත්‍ර විසින් ප්‍රතික්ෂේප කරන චෙක්පත් වල වියදම අදාල වාණිජ බැංකු වලින් අයකිරීමේ ක්‍රමයක් 1992 ජුනි මසදී හඳුන්වා දෙන ලදී.

## ව්‍යවහාර මුදල් නිකුතුව

1992 වර්ෂය තුළ මහ බැංකුව විසින් ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ බලධාරියා වශයෙන් දේශීය ගණුදෙනු සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ කාර්ය භාරය තවදුරටත් ඉටු කරනු ලැබීය. 1992 වර්ෂය අවසානය වන විට, සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 30,496 ක් විය. සංසරණයෙහි පැවති මුළු ව්‍යවහාර මුදල් වලින් සියයට 96 ක් නෝට්ටු වලින් සමන්විත විය.

1991 දී හඳුන්වා දුන් 'ශ්‍රී ලංකාවේ උරුමය' නම් වූ කාණ්ඩයට අදාලව 1992 දී මහ බැංකුව විසින් රු. 50/, රු. 20/- සහ රු. 10/- වටිනාකමින් යුත් නව මෝස්තරයන් සහිත මුදල් නෝට්ටු නිකුත් කරන ලදි.

ශ්‍රීමත් ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා පදවි ප්‍රාප්ත වී තෙවසරක් සම්පූර්ණ වීම සැමරීම සඳහා, 1992 ජනවාරි 02 දින මහ බැංකුව කාසියක් නිකුත් කරන ලදී. රුපියල් 1/- ක වටිනාකමින් යුත් මෙම විශේෂිත කාසිය, රිදියෙන් ටංකනය කෙරුණි. මෙම කාසිය සාමාන්‍ය සංසරණය සඳහා නිකල් හා තඹ ලෝහයෙන් ද නිම කරන ලදී. මහනුවර දළදා මාළිගාවේ මහ මළුවේදී අතිගරු ජනාධිපතිතුමන්ට මෙම කාසිය උත්සවශ්‍රීයෙන් පිළිගැන්වීම සිදු කෙරුණි. මහනුවර දළදා මාළිගාවේදී මහජනතාව සඳහා මෙම කාසිය නිකුත් කිරීමට විශේෂ විධිවිධාන ද සලස්වනු ලැබිය.

රිදියෙන් ටංකනය කළ රුපියල් 500/- ක් වටිනා කාසියක් නිකුත් කරමින් 2300 වෙනි අනුබුදු මිහිඳු ජයන්තිය සැමරීම සඳහා මහ බැංකුව විසින් කටයුතු සලස්වන ලදි. මෙම කාසිය, 1993 ජුනි මස පොසොන් උත්සව සමයේදී නිකුත් කිරීමට නියමිතව ඇත.

මහ බැංකුව විසින් 1991 දී ආරම්භ කරන ලද 'පිරිසිදු ව්‍යාවහාර මුදල් නෝට්ටු' භාවිතා කිරීමේ වැඩ පිළිවෙල, වාණිජ බැංකුවල සහාය ඇතිව 1992 වර්ෂය තුළදී ද අඛණ්ඩව කරගෙන යන ලදි.

මහ බැංකුවේ ජංගම ව්‍යාවහාර මුදල් ප්‍රදර්ශනය, 1992 වර්ෂය තුළ පැවැත්වුණි. නරඹන්නන්ට, විශේෂයෙන් පාසැල් ළමයින්ට අධ්‍යාපනික වටිනාකමක් ඇති මෙම ජංගම ප්‍රදර්ශනයේදී, ලෝකයේ බොහෝ රටවල ව්‍යාවහාර මුදල් නෝට්ටු වල ආදර්ශ ආකෘති, මෙන්ම ව්‍යාජ මුදල් නෝට්ටු සහ අඩුපාඩු සහිතව මුද්‍රණය වී ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාවහාර මුදල් නෝට්ටු ප්‍රදර්ශනය කෙරුණි. අනුරාධපුරය, පොළොන්නරුව, මාතලේ, මහනුවර, බදුල්ල, මොනරාගල සහ මාතර යන දිස්ත්‍රික්ක වල පිහිටි ග්‍රාමීය ප්‍රදේශ වල මෙම ජංගම ප්‍රදර්ශනය පැවැත්වුණි. මහ බැංකුව විසින් ප්‍රථම වතාවට මුදල් මාරු කරන කවුන්ටර සහිත කවුළුවක් සහ ව්‍යාවහාර මුදල් නෝට්ටු ප්‍රදර්ශනය කෙරෙන ජංගම ප්‍රදර්ශනයක් පවත්වමින්, 1992 ජුනි මාසයේදී බුත්තල පැවති 14 වෙනි ගම් උදාව ප්‍රදර්ශනයට සහභාගි විය.

සී.වී.සී.එස්. ක්‍රමය නමින් හැඳින්වෙන මුදල් නෝට්ටු හරි වැරදි බැලීමේ, ගණන් කිරීමේ හා තේරීමේ පද්ධති දෙකක් සවි කිරීමෙන් බැංකුව විසින් සිය ව්‍යාවහාර මුදල් පිළිබඳ ක්‍රියාවලිය ස්වයංක්‍රිය කරන ලදී. මෙම ක්‍රමයන් 1992 පෙබරවාරියේදී ආරම්භ වූ අතර, 1992 ජුනි වලදී නිල වශයෙන් පිළිගැණිනි. යන්ත්‍ර ක්‍රියාකරුවන් ස්වල්ප දෙනෙකු මගින්, වැඩි වේගයකින් සියලුම ව්‍යාවහාර මුදල් පිළිබඳ මෙහෙයුම් කටයුතු කිරීමට මෙම පද්ධති සමත්වී ඇත.

## බැංකු සංවර්ධනය

### ආයතනික පද්ධතිය

මෙරට බැංක පද්ධතිය 1992 වසර තුළදී තවදුරටත් පුළුල් විය. වසරේ පෙබරවාරි මාසයේදී අම්පාර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව (ප්‍රා.ග්‍රා.සං.බැං.) විවාත කළ අතර මැලේසියාවේ පබ්ලික් බෑන්ක් බර්හැඩ්හි ශාඛාවක් මාර්තු මාසයේදී බැංකු කටයුතු ආරම්භ කරන ලදී. අම්පාර ප්‍රා.ග්‍රා.සං.බැංකුව පිහිටුවීමත් සමඟ ප්‍රා.ග්‍රා.සං.බැංකු පද්ධතිය නැගෙනහිර පළාතටද ව්‍යාප්ත වීම ඇරඹුනු අතර, මුළු ප්‍රා.ග්‍රා.සං.බැංකු සංඛ්‍යාව 16 ක් විය. පබ්ලික් බෑන්ක් බර්හැඩ් ශාඛාව විවාත කිරීම, දශකයකට ආසන්න කාලයකින් පසු විදේශ බැංකුවක ශාඛාවක් මෙරට ආරම්භ කිරීම සනිටුහන් කළ බැවින් විශේෂ වැදගත්කමක් දරයි.

වසර තුලදී බැංකු ක්ෂේත්‍රය තුල සිදුවූ තවත් වැදගත් සිද්ධියක් නම් සී/ස බැන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටනැෂනල් (බීසීසීඅයි) හී ශාඛා 03 ක දේශීය බැංකු කටයුතු සෙලාන් බැංකුව යටතට පැවරීමයි. අදාල බලධාරීන් විසින් බීසීසීඅයි (බැංකුව) ඇවර කිරීමට කටයුතු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙරට ක්‍රියාත්මකව පැවැති මුළු විදේශ වාණිජ බැංකු සංඛ්‍යාව 1992 තුළදීද 17 ක් ලෙස නොවෙනස්ව පැවැතිනි. සංවර්ධන බැංකු ආයතනද ඇතුලත්ව 1991 දී 42 ක් වූ බැංකු ව්‍යාපාර කටයුතු වල නිරත මුළු ආයතන සංඛ්‍යාව 1992 දී 43 දක්වා වැඩිවිය.

1992 වසර තුලදී ප්‍රා.ග්‍රා.සං.බැංකු, දේශිය පෞද්ගලික බැංකු සහ විදේශීය වාණිජ බැංකු තම ශාඛා පද්ධතිය පුලුල් කළහ. පෙර වර්ෂයේ මෙන්ම, රාජ්‍ය වාණිජ බැංකු එනම් ලංකා බැංකුව සහ මහජන බැංකුව තම ශාඛා පද්ධතිය පුලුල් කිරීම් සම්බන්ධයෙන් සාපේක්ෂව අඩු ප්‍රගතියක් දැක්වූහ. ලංකා බැංකුව එක් ශාඛාවක් (කොග්ගල) පමණක් විවෘත කළ අතර, එහි වැල්ලවාය කෘෂිසේවා මධ්‍යස්ථාන ශාඛාව පූර්ණ බැංකු ශාඛාවක මට්ටමට අධි ශ්‍රේණිගත කරන ලදී. මේ නිසා එහි ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 252 ක් දක්වා වැඩිවූ අතර, 1991 දී 36 ක් වූ කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා සංඛ්‍යාව 1992 දී 35 ක් දක්වා අඩුවිය. ලංකා බැංකුව විසින් ව්‍යාප්ති කාර්යාල 04 ක්ද විවෘත කරන ලදී. මේ අතර, ලංකා බැංකුවේ කච්චේරි ශාඛා සංඛ්‍යාව 24 ක් ලෙස නොවෙනස්ව පැවැතිනි. මහජන බැංකුවද තම මුළු ශාඛා සංඛ්‍යාව 313 ක් දක්වා වැඩිකරමින් එහි ශාඛා 05 ක් එනම් කොළඹ ශාඛා 2 ක් සහ කැස්බෑව, කොට්ටාව, සහ කොග්ගල, එක් ශාඛාව බැගින් විවෘත කරන ලදී.

1992 වර්ෂය තුලදී, සී/ස ලංකා වාණිජ බැංකුව එහි මුළු ශාඛා සංඛ්‍යාව 28 දක්වා වැඩිකරමින්, ශාඛා 07 ක් විවෘත කරන ලදී. 1992 වර්ෂය ආරම්භයේදී ශාඛා 41 කින් යුක්ත වූ සී/ස හැටන් නැෂනල් බැංකුව, නව ශාඛා 07 ක් විවෘත කරන ලදී. සී/ස සෙලාන් බැංකුව ශාඛා 15 විවෘත කරමින් එහි ශාඛා පද්ධතියේ සීඝ්‍ර ව්‍යාප්තියක් පෙන්විය. විමසුමට ලක්වන වසර අවසානයේදි සෙලාන් බැංකුව වෙත පවරන ලද බීසීසීඅයි ශාඛා 03 ද ඇතුලත්ව බැංකුව සතුව අංගසම්පූර්ණ බැංකු ශාඛා 44 ක් විය. පසුගිය වර්ෂයේදී නව බැංකු ශාඛා විවෘත නොකළ සී/ස සම්පත් බැංකුව 1992 වර්ෂය තුලදී ශාඛා 3ක් විවෘත කරමින් තම ශාඛා පද්ධතිය ශාඛා 16 ක් දක්වා පුලුල් කරන ලදී.

වර්ෂය තුලදී විදේශීය වාණිජ බැංකුද තම ශාඛා පද්ධතිය පුලුල් කිරීමට කටයුතු කරන ලදී. හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් (හොංකොන් බැංකුව), විසින් ශාඛා 03 ක් විවෘත කළ අතර, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, ශාඛා 02 ක් විවෘත කරන ලදී. වසර තුලදි ග්‍රින්ඩ්ලේස් බැංකුව ශාඛාවක් විවෘත කළේය. වර්ෂය ආරම්භයේදී බීසීසීඅයි (BCCI) බැංකු ශාඛා 03 ක දේශීය බැංකු කටයුතු සෙලාන් බැංකුව යටතට පවරන ලද අතර, පබ්ලික් බැන්ක් බර්හැඩ්හි හි ශාඛාවක් කොළඹ විවෘත කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1991 අවසානයේදී 25 ක්ව පැවැති විදේශිය බැංකු ශාඛා සංඛ්‍යාව 1992 අග වන විට 29 දක්වා වැඩිවිය.

වර්ෂය තුලදී, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුද (ප්‍රා.ග්‍රා.සං. බැංකු) තම ශාඛා පද්ධතිය පුලුල් කළහ. මාතර ප්‍රා.ග්‍රා.සං. බැංකුව වල්ගම, දෙනියාය, තිහගොඩ සහ කඹුරුපිටිය, යන ස්ථානයන්හි ශාඛා 04 ක් විවෘත කළ අතර, ගාල්ල ප්‍රා.ග්‍රා.සං.බැංකුව, ගාල්ල, ඌරුගස්මහන්හන්දිය, සහ යක්කල මුල්ල යන ස්ථානයන්හි ශාඛා 03 ක් විවෘත කළේය. බදුල්ල ප්‍රා.ග්‍රා.සං.බැංකුව තම ශාඛා 03 ක් ඌව-පරණගම, බණ්ඩාරවෙල සහ රිදීමාලියද්ද යන ස්ථානයන්හි විවාත කළේය. කළුතර, කුරුණෑගල, මහනුවර, නුවරඑළිය, පොළොන්නරුව, සහ රත්නපුර ප්‍රා.ග්‍රා.සං. බැංකු වර්ෂය තුලදී ශාඛා 02 ක් බැගින් විවාත කළහ. මේවා පිළිවෙලින් බදුරලිය සහ කළුතර උතුර, නාරම්මල සහ පොල්පිතිගම, මැණික්හින්න සහ දවුලගල, හඟුරන්කෙත සහ කොටගල බකමූණ සහ මනම්පිටිය හා ඇහැළියගොඩ සහ කොලොන්න යන ස්ථානයන්හි වූහ. අනුරාධපුරය, හම්බන්තොට, කෑගල්ල, පුත්තලම හා මාතලේ ප්‍රා.ග්‍රා.සං. බැංකු, පිළිවෙලින් ගෝනපතිරාව, වීරකැටිය, හෙම්මාතගම, මහවැව සහ නාවුල යන ස්ථානයන්හි එක් ශාඛාවක් බැගින් විවෘත කළහ. 1992 වර්ෂයේදී පිහිටුවන ලද අම්පාර ප්‍රා.ග්‍රා.සං. බැංකුව, අම්පාර, දෙහිඅත්තකණ්ඩිය, සමන්තුරේ, දමන සහ අක්කරෙයිපත්තුව

යන ස්ථානයන්හි ශාඛා 05 ක් විවෘත කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1991 දී 124 ක් වූ ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා සංඛ්‍යාව 1992 දී 156 ක් දක්වා වැඩිවිය.

1992 වර්ෂය තුලදී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ශාඛා 03 ක් විවෘත කරමින් තම ශාඛා පද්ධතිය 84 ක් දක්වා පුලුල් කරන ලදී. මේ අතර ජාතික සංවර්ධන බැංකුව, ලංකා සංවර්ධන මුදල් සංස්ථාව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව යන සංවර්ධන බැංකු ආයතනවල කාර්යාල පද්ධතිය නොවෙනස්ව පැවතුනි.

වර්ෂය තුලදී, සී/ස සෙලාන් බැංකුව විසින් තම පාලිත සමාගමක් ලෙස සී/ස සෙලාන් මර්චන්ට් බැංකුව නමින් වණික් බැංකුවක් ස්ථාපනය කිරීමෙන් වණික් බැංකු සංඛ්‍යාව 4ක් දක්වා වැඩිවිය.

ජංගම බැංකු සේවා

බැංකු පහසුකම් අඩු හා බැංකු පහසුකම් නොමැති ප්‍රදේශවල බැංකු සේවා අවශ්‍යතා ඉටුකිරීම සඳහා ප්‍රා.ග්‍රා.සං. බැංකු සහ ඇතැම් වාණිජ බැංකු 1992 වර්ෂය තුලදීද ජංගම බැංකු සේවාවන් සැපයුහ. සෙලාන් බැංකුව, ගම්පහ දිස්ත්‍රික්කයේ වැලිවේරිය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මනම්පිටිය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ බොගවන්තලාව සහ කොටගල යන ස්ථානයන්හි ජංගම බැංකු සේවා මධ්‍යස්ථාන ආරම්භ කළේය. හැටන් නැෂනල් බැංකුවද, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධන පුර රෝහළ, තලංගම පිහිටි ජාත්‍යන්තර වාරි කළමණාකරණ ආයතනය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ බොගවන්තලාව යන ස්ථානවල ජංගම බැංකු සේවා ආරම්භ කරන ලදී.

ස්වයංක්‍රීය බැංකු ගණුදෙනු යන්ත්‍ර සවිකිරීම

1992 වර්ෂය තුළදී බැංකු ශාඛා පද්ධතිය සීග්‍රයෙන් ව්‍යාප්ත වුවද බැංකු ශාඛා පරිශ්‍රයන්ගෙන් පිටත පිහිටි ස්වයංක්‍රීය බැංකු ගණුදෙනු යන්ත්‍ර සවිකිරීම අඩු ප්‍රගතියක් පෙන්නුම් කළේය. වර්ෂයතුළ සවයංක්‍රීය බැංකු ගනුදෙනු යන්ත්‍ර එකක් පමණක් සවිකරන ලදී ඒ හැටන් නැෂනල් බැංකුව විසින් ගල්කිස්ස සුපිරි වෙළඳ සැලෙහිය.

## බැංකු අධීක්ෂණ

වාණිජ බැංකු අධීක්ෂණය කිරීම සහ විධිමත් කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීම වේ. 1992 පෙබරවාරි මස මුදල් නීති පනතට කරන ලද සංශෝධන අනුව වාණිජ බැංකු නොවන ඕනෑම බැංකු ආයතනයන් ද ඇතුළත් වන පරිදි අධීක්ෂණ කාර්ය භාරය පුලුල් කළ අතර, එමගින් එකී ආයතන මගින් කර ගෙන යනු ලබන අනාරක්ෂිත සහ අවිධිමත් කටයුතු ඇනහිටුවීමට සහ වළක්වාලීමට නියෝග නිකුත් කිරීමට ද, ව්‍යාපාරයේ යම් කටයුත්තක් කරගෙන යා යුතු ස්වරූපය හා පිළිවෙල පිළිබඳව නියෝග නිකුත් කිරීමට ද මුදල් මණ්ඩලය වෙත බලතල ලැබිණි. සංශෝධිත විධිවිධාන වල 'බැංකු ආයතනය' යන පදය වණික් බැංකු කටයුතු කරනු ලබන්නේ යයි මුදල් මණ්ඩලය අදහස් කරන ඕනෑම ආයතනයක් ද ඇතුළත් වන පරිදි නිර්වචනය කර ඇත.

දෙපාර්තමේන්තුව මෙම වගකීම් ස්ථානීය පරීක්ෂණ සහ ස්ථානීය නොවන අධීක්ෂණ මගින් ක්‍රියාත්මක කරන ලදී. බැංකු පරීක්ෂණය සඳහා දෙපාර්තමේන්තුව සතු බලතල ක්‍රියාත්මක කරමින්, 1992 වර්ෂය තුළ වාණිජ බැංකු 09 ක සහ එක් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක අධීක්ෂණ කටයුතු ආරම්භ කරන ලද අතර, වර්ෂය තුළ දී මින් 07 ක කටයුතු නිම

කරන ලදී. මීට අමතරව බැංකු ආයතනයක් ලෙස ප්‍රකාශ කිරීමත් සමග ප්‍රථම වරට ජාතික සංවර්ධන බැංකුව අධීක්ෂණය කිරීම ද දෙපාර්තමේන්තුව මගින් අරඹන ලදී. 1991 වර්ෂයේ දී පරීක්ෂණ කටයුතු ආරම්භ කළ වාණිජ බැංකු 03 ක කටයුතු ද 1992 වර්ෂය තුළ දී නිම කෙරිණි.

වාණිජ බැංකු පිළිබඳ ස්ථානීය නොවන පරීක්ෂණ සම්බන්ධව සළකන විට, දෙපාර්තමේන්තුව මගින් වාණිජ බැංකු වලත්, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු යොජනා ක්‍රමය යටතේ පිහිටුවන ලද විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන් හිත්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලත් මූල්‍ය තත්ත්වය ඒවා මගින් ඉදිරිපත් කරන ලද මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශණයන් පදනම් කරගෙන අඛණ්ඩව නිරීක්ෂණය කර ගෙන යන ලදී. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක විසින් නේවාසික අපනයන කරුවන්ට දෙන ලද ණය පිළිබඳ වැඩි විස්තර ඇතුළත් වන පරිදි ඒවායේ තොරතුරු වාර්තා කිරීම පුළුල් කෙරිණි. වාණිජ බැංකු වල වර්ධනයන් පිළිබඳව අඛණ්ඩ නිරීක්ෂණයක් පවත්වාගෙන යාම මෙකී ස්ථානීය නොවන අධීක්ෂණයන් හි අරමුණ වේ. අක්‍රමික සහ විශාල අත්තිකාරම්, තැන්පතු සහ අනෙකුත් බැරකම්, ආයෝජන, ආදායම් හා වියදම් වැනි කරුණු පිළිබඳව මාසිකව, අර්ධ වාර්ෂිකව සහ වාර්ෂිකව එවනු ලබන වාර්තා පදනම් කරගෙන එක් එක් වාණිජ බැංකුවේ ලාභාදායිත්වය සහ මූල්‍ය ස්ථාරත්වය නිගමනය කිරීමත්, බැංකු ක්ෂෙත්‍රයෙහිම සාමාන්‍යය සමඟ එක් එක් බැංකුවේ තත්ත්වය සංසන්දනාත්මකව තක්සේරු කිරීමත්, දෙපාර්තමේන්තුව මගින් කරගෙන යන ලදී.

බැංකු පනත යටතේ දැක්වෙන ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සහ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අනෙකුත් නියෝග තරයේ ක්‍රියාත්මක කරන බව සහ ඒවාට අනුකූලව කටයුතු කරන බවට වග බලා ගැනීම මෙම දෙපාර්තමේන්තුව සතු ඉතාම වැදගත් කර්තව්‍යයකි. අවම ද්‍රවශීල වත්කම් මට්ටම සහ ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වා ගැනීම, එක් ණයකරුවකුට දිය හැකි ණය සීමා පිළපැදීම, අධ්‍යක්ෂ වරුන්ට සහ අධ්‍යක්ෂ වරුන්ට සම්බන්ධ අයට අත්තිකාරම් දීම පිළිබඳ සීමාවන් අනුගමනය කිරීම ආයෝජන සීමාවන් සහ ණය උපරිමයන් මෙම නියෝග වලට ඇතුළත් වේ. වාණිජ බැංකු විදේශ කාරක ශේෂ සහ ප්‍රමුඛ නො වන අංශ සඳහා වූ ණය සීමා හා ණයවර ලිපි මත වූ ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතා මහ බැංකු විසින් පැනවූ සීමාවන්ට අනුකූල දැයි දෛනිකව අධීක්ෂණය කිරීම දෙපාර්තමේන්තුවේ උප කටයුතු යටතට එක් විය.

අක්‍රීය ණය සඳහා වෙන් කිරීම සම්බන්ධයෙන් 1991 පෙබවරවාරි මාසයේ දී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාව පරිදි, සියළුම වාණිජ බැංකු විසින් බොල්, අඩමාන සහ උප ප්‍රමාණික වශයෙන් වර්ගීකරණය කරන ලද ණය සඳහා පිළිවෙලින් සියයට 100 ක්, සියයට 50 ක් සහ සියයට 20 ක් වශයෙන් වෙන්කිරීම් කළ යුතු වූ අතර, 1992 අප්‍රේල් වන විට වෙන්කිරීම් අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු විය. මෙම ප්‍රතිපාදන කිරීමේ දී සුරැකුම් වල අගය තක්සේරු කිරීම උපදෙස් මාලාවේ අඩංගු වූ ප්‍රධාන අංගයක් විය. ඒ අනුව, වර්ෂය තුළ මෙම අවශ්‍යතාවයන් විධිමත්ව සපුරාලීම පිළිබඳ අධීක්ෂණය කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුවෙහි විශේෂ අවධානය යොමු කෙරිණි.

ලංඩන් හීදී ක්‍රෙඩිඩ් ඇන්ඩ් කෝමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුව බිඳ වැටීම සහ 1991 ජුලි මාසයේ දී ජාත්‍යන්තරව එහි බැංකු කටයුතු අත්හිටුවීම හේතුවෙන් සීමාසහිත ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් (විදේශ) බැංකුවේ දේශීය බැංකු ඒකකයේ කටයුතු 1991 අංක 02 දරණ හදිසි නීති (බැංකු විශේෂ විධි විධාන) රෙගුලාසි යටතේ 1992 ජනවාරි මස 01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි සීමාසහිත සෙලාන් බැංකුවට පවරන ලදී. ඒ නිසා, ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවෙහි කටයුතු සම්බන්ධ කරුණු ගණනාවක් පරීක්ෂා කොට විසඳුම් යෙදීම සඳහා දෙපාර්තමේන්තුව සෘජුව මැදිහත් විය. මේවා අතරින්, ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවේ අනේවාසික හා නිර්නේවාසික ගිණුම් හිමියන්ට සහනයක් සැළසීමේ අරමුණින් සහන ගෙවීම් ක්‍රමයක් සැකසීම ඉතා වැදගත් පියවරක් විය. මෙම සහන ක්‍රමය පිළිවෙලින් 1992 ජනවාරි සහ ඔක්තෝබර් මාසයන් හි දී පියවර දෙකක දී ආරම්භ කෙරිණි. මෙම සහන ක්‍රමයේ මුල් පියවර යටතේ, ඇමරිකානු ඩොලර් 4000 ට අඩු

තැන්පතු ශේෂ හිමියන්ට සම්පූර්ණ මුදලම ගෙවන ලද අතර, ඊට වඩා විශාල තැන්පතු ශේෂ හිමි අයට කොටස් වශයෙන් ගෙවීම් කරන ලදී. ඒ අනුව, තැන්පතු ශේෂයේ විශාලත්වය අනුව, අනුක්‍රමිකව අඩුවන කොටසක් විශාල තැන්පත හිමියන්ට ලැබිණ. මුල් පියවර යටතේ සම්පූර්ණ තැන්පත් මුදල නො ලැබුණු විශාල තැන්පතු හිමියන් ට දෙවන අදියර යටතේ මුළු මුදලම ලබා ගත හැකි විය. ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවීම් කෙරුණු අතර, එය නැවත විදේශ මුදල් වලට පරිවර්තනය කළ නො හැකිය, යන කොන්දේසියට යටත් විය. ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවෙහි විදේශ ව්‍යවහාර මුදල් ඒකකය සම්බන්ධයෙන් වූ ප්‍රශ්න විසඳා ගැනීම උදෙසා දැනට ඇවරකරුවන් සමඟ සාකච්ඡා කෙරෙමින් පවතී.

රාජ්‍ය බැංකු දෙක සම්බන්ධව සළකන විට, මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ස්ථානීය පරීක්ෂණ වල දී මෙම බැංකු මගින් බොල් ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොකර ඇති බව කළමණාකරණයේ අවධානයට යොමු කරන ලදී. රජය මගින් මීට පිළියම් යෙදීමට අදහස් කර ඇති අතර, දැනටමත් ඒවායේ ප්‍රාග්ධන ව්‍යුහය ජාත්‍යන්තර මට්ටමට තහවුරු කිරීම සඳහා මෙම බැංකු දෙක ප්‍රතිප්‍රාග්ධනකරණය කිරීමට පියවර ගෙන ඇත.

1987 වර්ෂයේ ක්‍රියාත්මක කෙරුණු තැන්පතු රක්ෂණ ක්‍රමය විමර්ශණයට භාජනය කෙරෙන වසර තුළ දී ද දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරන ලදී. කෙසේ වෙතත්, මෙම රක්ෂණ ක්‍රමයට සහභාගී වූ වාණිජ බැංකු දෙකක් ඉන් ඉවත් වීම නිසා වර්ෂය තුළ ලියාපදිංචිව පැවති ආයතන සංඛ්‍යාව 11 දක්වා පහත වැටිණි. වර්ෂය තුළ දී රක්ෂණ වාරිකය එක් කාර්තුවකට සෑම රුපියල් 100/- ක් සඳහා ශත 01 ක සිට ශත 3.75 දක්වා වැඩි කෙරිණි.

බැංකු පනතට සහ මුදල් නීති පනතට සංශෝධනයන් දැනට කෙරෙමින් පවතින අතර, මෙම සංශෝධනයන් සැකසීම සඳහා දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ලෙස සහභාගී වේ. මූල්‍ය සහ බැංකු කටයුතු පිළිබඳ ජනාධිපති කොමිෂම වෙත බැංකු අධීක්ෂණය හා විධිමත් කිරීම සම්බන්ධ ප්‍රශ්න ගණනාවක් පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

## බැංකු නොවන මූල්‍ය ආයතන

මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය සමාගම් පිළිබඳව එතැන් පරීක්ෂණ සහ එම සමාගම් විසින් සපයනු ලබන සංඛ්‍යාත්මක දත්ත ඇසුරෙන් කෙරෙන දුරස්ථ පරීක්ෂණ මගින් මූල්‍ය ආයතන මෙහෙයුම හා අධීක්ෂණය මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යනු ලැබීය.

1992 වර්ෂය තුලදී 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනත යටතේ සමාගම් 4 ක් ලියාපදිංචි කරන ලදී. 1991 වර්ෂය තුල මුදල් ව්‍යාපාර කටයුතුවල නිරතව සිටි මුදල් සමාගම් 24 න් එක් සමාගමකට අලාභ හේතුකොටගෙන රුපියල් දශලක්ෂ 5 ක ඌන නොවූ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යෑමට අපොහොසත් වීම නිසා මුදල් ව්‍යාපාරවල නිරතවීමට නොහැකි විය.

1988 දී මුදල් මණ්ඩලය විසින් සකස් කරන ලද තැන්පතු සහන ගෙවීමේ ක්‍රමය 1992 වර්ෂය තුලදීද නොකඩවා ක්‍රියාත්මක කරනලදී. මේ යටතේ දුෂ්කරතාවයට පත් වූ මූල්‍ය සමාගම් 8 ක මුලු තැන්පතු සංඛ්‍යාව වූ 40,590 න් 1992 වර්ෂය අවසාන වන විට තැන්පත් 36,111 කට සහන ගෙවීම් කර තිබිණ. ගෙවන ලද මුළු මුදල් වටිනාකම රුපියල් දශ ලක්ෂ 462 ක් විය. මෙම ක්‍රමය යටතේ සහන මුදල් ගෙවන ලද්දේ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහබැංකුව විසින් සපයන ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකම් මගිනි. 1992 වර්ෂය තුල තැන්පතු සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සපයන ලද මුලු මුදල රුපියල් දශලක්ෂ 80 ක් විය. එක් සමාගමක් විසින් තම වත්කම් මුදල් කිරීමෙන් සහ ණයමුදල් ආපසු අයකර ගැනීමෙන් ලබාගන්නා ලද මුදල්වලින් අමතර සහන ගෙවීම් කරන ලදී.

මූල්‍ය අපහසුකම්වලට භාරනය වෙමින් සිටි ලියාපදිංචි මූල්‍ය සමාගමක පරිපාලනය සහ කළමනාකරණය 1992 පෙබරවාරි මස දී මුදල් මණ්ඩලය විසින් පවරා ගන්නා ලදුව, එම සමාගමට ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සපයන ලදි. මෙම සමාගමට 1992 වර්ෂයේදී සපයන ලද සම්පූර්ණ ප්‍රතිමූල්‍ය ණය මුදල රුපියල් දශ ලක්ෂ 813 ක් විය.

1992 වර්ෂය තුලදී මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් විධානයන් නිකුත් කරනු ලැබිය.

## තනි ණය ගැණුම්කරු සීමා විධානය.

1992 ජුනි මස 19 වෙනි දින නිකුත් කරනලද මෙම විධානයට අනුව, තනි ණයගැනුම්කරුවකුට ප්‍රධානය කරනු ලබන එක් අත්තිකාරමක උපරිමය හෝ එවැන්නකුට ප්‍රදානය කරනු ලැබූ අත්තිකාරම්වල එකතුව සහ එවැන්නකුට ප්‍රදානය කරනලද අත්තිකාරම්වලින් යම් අවස්ථාවක හිඟව පවත්නා එකතුව ලියාපදිංචි කළ මුදල් සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වලින් සියයට 10 නොඉක්මවිය යුතුය. එසේම පොදු අධ්‍යක්ෂවරයන්, පොදු හවුල්කරුවන් හෝ පොදු අයිතිකරුවන් සහිත සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් ණයගැනුම්කරුවන් සමූහයක් වෙත ප්‍රදානය කරනලද තනි අත්තිකාරමක උපරිමය හෝ අත්තිකාරම්වල එකතුව සහ යම් එක් අවස්ථාවක හිඟව පවත්නා එකතුව, එම ලියාපදිංචි කළ මූල්‍ය සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වලින් සියයට 15 නොඉක්මවිය යුතුය.

## බොල්ණය සහ අඩමාන ණය වෙන් කිරීම් පිළිබඳ 1992 අංක 2 දරණ විධානය සඳහා වූ සංශෝධනය

1992 ඔක්තෝබර් 24 දින මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනලද මෙම සංශෝධිත විධානයට අනුව, මූල්‍ය සමාගම් විසින් පහත දැක්වෙන ආකාරයෙන් බොල්ණය සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම කළ යුතුය.

(i) මාස 12 සිට 24 දක්වා වූ කාලසීමාවක් සඳහා හිඟව ඇති සියලු අත්තිකාරම්වලින් සියයට විසිපහක් (25%):

(ii) මාස 25 සිට 36 දක්වා වූ කාල සීමාවක් සඳහා හිඟව ඇති සියලු අත්තිකාරම්වලින් සියයට පනහක් (50%):

(iii) මාස 36 ට වැඩියෙන් හිඟව ඇති සියලු අත්තිකාරම්වලින් සියයට සියයක් (100%):

එසේම, ඉහත සඳහන් අතුරු විධානය අනුව කටයුතු කිරීම පැහැර හරින යම් මූල්‍ය සමාගමක් 1992 මාර්තු මස 31 වැනි දිනයෙන් අවසන් මුදල් වර්ෂය සඳහා වූ ලාභවලින් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකිය යුතුය යනුවෙන් සංශෝධනය මගින් තවදුරටත් විධානය කරන ලදී.

මහජන ආරක්ෂක පනත යටතේ, තැන්පත්කරුවන්ට සහන ගෙවීම සම්බන්ධයෙන් නව රෙගුලාසියක් 1992 ජනවාරි 29 වැනි දින ජනාධිපතිතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නියෝගයට අනුව, මූල්‍ය සමාගම් පනතේ 20 වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත යම් මූල්‍ය සමාගමක් පවරාගෙන ඇති අවස්ථාවකදී, තැන්පත්කරුවන්ගේ ඉල්ලීම් සපුරාලීම සම්බන්ධයෙන් වූ එම මූල්‍ය සමාගමේ වගකීම, එසේ පවරා ගනු ලැබූ මූල්‍ය සමාගමේ ව්‍යාපාර කටයුතු සමාලෝචනය කිරීමෙන් පසුව මුදල් මණ්ඩලය තීරණය කරනු ලබන සහන ගෙවීම් වලට පමණක් සීමාවනු ඇත.

1991 වර්ෂය තුලදී මුදල් මණ්ඩලය විසින් මූල්‍ය සමාගම් 4 ක ව්‍යාපාර කටයුතු ඇවර කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවිය වෙත අයදුම්පත් ඉදිරිපත් කරන ලදී. මේ අතුරින්, 1992 දී සී./ස. සාරභූමි ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික) සමාගම ඇවර කිරීම සඳහා උසාවිය විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා ඇවර කරුවකු පත්කරන ලදී. සී./ස. හිදෙකි ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් සහ සී./ස. කාසල් ෆිනෑන්ස් යන සමාගම් පිළිබඳ පෙත්සම් තවදුරටත් කොළඹ දිස්ත්‍රික් උසාවියේ විභාග වෙමින් පවතී. ස./ස. නිවාස හා දේපල වෙළඳාම් සමාගම ඇවර කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ පවරන ලද නඩුව, එම සමාගමෙහි අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරනලද තැන්පතු වගකීම් ආපසු ගෙවීමේ යෝජනාවකට එකඟවීමෙන් අනතුරුව මුදල් මණ්ඩලය විසින් ඉවත් කරගන්නා ලදී.

## සංවර්ධන මුදල්

මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි පරිපාලන කටයුතු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වූ ණය ආවරණ සහතික ක්‍රමය මෙහෙයවීම, බස්රථ මිළදී ගැනීමේ ණය සහතික ක්‍රමය හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන පවත්වාගෙන යාම 1992 වසර තුළදී ද මහ බැංකුවේ සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව (සං.මු.දෙ) වෙත පැවරුනු වගකීම විය. එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතන (එ.ජ.ජා.සං.ආ.) සහතික කළ අඩු ආදායම් නිවාස වැඩසටහන යටතේ අඩු ආදායම් කාණ්ඩ සඳහා නිවාස ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම 1992 ජූලි මාසයේදී සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී.

### මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ.දි.ණ.අ.)

මෙම ණය සහතික ක්‍රමය යටතේ සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් 1991 දෙසැම්බර් මාසයේදී නැවත දැනුම් දෙනතුරු අත්හිටුවන ලද අතර, එම තත්ත්වය 1992 වසර තුළදී ද නොවෙනස්ව පැවතුණි. එසේ වුවද, මැ.දි.ණ.අ. යටතේ පෙර වර්ෂ වලදී ප්‍රතිමූල්‍ය කරණය කරන ලද ව්‍යාපෘතීන් සම්බන්ධ පසුවිපරම් කිරීම, මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

### ණය ආවරණ සහතික ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලැබූ ණය ආවරණ සහතික ක්‍රම හය යටතේ ක්‍රියාත්මක වූ ණය ආවරණ සහතික ක්‍රියාවලිය පිළිබඳව 1992 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා අදාල සංක්ෂිප්ත විස්තරයක් 2.5 සහ 2.6 සංඛ්‍යා සටහන්හි අනුපිළිවෙලින් දක්වා ඇත.

### සුළු පරිමාණ කර්මාන්ත (සු.පරි.ක.) යෝජනා ක්‍රමය.

සු.පරි.ක. යෝජනා ක්‍රමය යටතේ 1978 - 1981 කාලපරිච්ඡේදයේදී සහතික කරන ලද 767 ක් වූ මුළු ණය මුදල් සංඛ්‍යාවෙන් රුපියල් දශ ලක්ෂ 0.58 ක් වටිනා ණය මුදල් 10 ක් පමණක් 1992 වසර අවසන් වන විට ක්‍රියාත්මකව පැවැතුනි. කල් ඉකුත් වූ ණය ලෙසින් වර්ගීකරණය කරනු ලැබූ මෙම ණය සඳහා ඇප ආවරණ වගකීම් රුපියල් දශ ලක්ෂ 0.44 ක් විය.

### සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත -I (සුමක 1) ණය යෝජනා ක්‍රමය.

සුමක 1 ණය යෝජනා ක්‍රමය යටතේ 1979 - 1992 කාලපරිච්ඡේදය තුළදී රුපියල් දශ ලක්ෂ 286 ප්‍රමාණයක ණය මුදලක් ආවරණය වන පරිදි ඇප ආවරණ සහතිකපත් 1,670 ක් නිකුත් කරන ලදී. නිකුත් කරන ලද මුළු සංඛ්‍යාව අතුරින් රුපියල් දශ ලක්ෂ 30 ක් වටිනා ණය සහතික 112 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස්, සහභාගිත්ව ණය දෙන ආයතන විසින් නිසිපරිදි අනුගමනය නොකිරීම හේතුකොට ගෙන ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. මෙම ණය සහතික ක්‍රමය යටතේ ලබාගත් ණය මුදල් 1,216 ක් ගෙවා අවසන් කර ඇත. 1992 වසර තුළදී රුපියල් දශ ලක්ෂ 33 ක වගකීමක් සහිත

හිමිකම්පෑම් 334 ක් ලැබුණු අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 18 ක් වන හිමිකම්පෑම් 224 ක් සමථයකට පත්කරන ලදී. ව්‍යාපෘති පරීක්ෂණයකින් තොරව, දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වල සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් සඳහා ගෙවීම් පිළිබඳව ගන්නා ලද තීරණයකට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් සියයට 50 නොඉක්මවන පරිදි හිමිකම්පෑම් 27 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 2.1 ක අතුරු දීමනාවක් ගෙවා ඇත. හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් දශ ලක්ෂ 2 ක වටිනාකමින් යුත් හිමිකම්පෑම් 37 කට අදාල ණය මුදල් ප්‍රමාණයක් ණය කරුවන් විසින් ගෙවන ලද අතර මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් නිසි ලෙස පිළිනොපැදීම හේතුකොට ගෙන සම්පූර්ණ වටිනාකම රුපියල් දශ ලක්ෂ 4.8 ක් වූ හිමිකම්පෑම් 28 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සහභාගිත්ව ණය දෙන ආයතන විසින් දියත් කරන ලද පුනරුත්ථාපන වැඩසටහන කරණකොට ගෙන හෝ ණයකරුවන් විසින් ණය මුදල් ගෙවීම් යළි ආරම්භ කිරීම හේතුකොට ගෙන රුපියල් දශ ලක්ෂ 3 ක වටිනාකමින් යුත් හිමිකම්පෑම් 12 ක් සඳහා ගෙවීම් කිරීම සලකා බැලීම කල්දැමීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවිය. 1992 දෙසැම්බර් මාසය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 5.8 ක උපරිම ඇප ආවරණ වගකීම් ඇතුළත් රුපියල් දශ ලක්ෂ 9.7 ක වටිනාකමක් ඇති ණය මුදල් 61 ක් පමණක් ක්‍රියාත්මක වෙමින් පැවති බව වාර්තා වී ඇත. මෙම ක්‍රමය යටතේ මහ බැංකුව විසින් රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය හා පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකිරීම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 12.1 ක් හා 5.4 ක් විය.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත II (සුමක II) ණය යෝජනා ක්‍රමය.**

සුමක II ණය යෝජනා ක්‍රමය යටතේ 1982 - 1989 කාලපරිච්ඡේදය තුළදී සහතික කරන ලද ණය මුදල් 2531 න් රුපියල් දශ ලක්ෂ 442 ක් වටිනා ණය මුදල් 1111 සම්පූර්ණයෙන්ම ගෙවා නිම කළ අතර රුපියල් දශ ලක්ෂ 167 ක වටිනාකමින් යුත් ඇප ආවරණ 340 ක් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නොපිළිපැදීම හේතුකොට ගෙන, ඉවත්කර ගැනීම හෝ ඇප ආවරණ වල කාලය ඉකුත් වීම නිසා ඒවා අහෝස් වීම හෝ සිදුවී ඇත. 1992 වසර අවසානයේදී මෙම ක්‍රමය යටතේ ලැබූ රුපියල් දශ ලක්ෂ 50 ක වගකීමක් සහිත සම්පූර්ණ හිමිකම්පෑම් අයදුම්පත් සංඛ්‍යාව 204 කි. එයින් රුපියල් දශ ලක්ෂ 26 ක වටිනාකමින් යුත් හිමිකම්පෑම් 113 ක් සමථයකට පත්කරන ලදී. උතුරු හා නැගෙනහිර පළාත්වල සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් 5 ක් වෙනුවෙන්, මහ බැංකුවේ වගකීමෙන් සියයට 50 ක් නොඉක්මවන පරිදි රුපියල් දශ ලක්ෂ 0.7 ක අතුරු ගෙවීමක් සිදුකොට ඇත. එසේම සහභාගිත්ව ණය දෙන ආයතන විසින් මෙම ණය ක්‍රමයට අදාල වූ මෙහෙයුම් උපදෙස් පිළිනොපැදීම හේතුකොට ගෙන, ඉදිරිපත් කරනු ලැබූ රුපියල් දශ ලක්ෂ 9.1 ක වටිනාකමින් යුත් හිමිකම්පෑම් අයදුම්පත් 39 ක් ප්‍රතික්ෂෙප කරන ලදී. මහ බැංකුවට හිමිකම්පෑම් අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, හිමිකම්පෑම් අයදුම්පත් 2 ක් සඳහා අදාල ණය මුදල් ණයකරුවන් විසින් ගෙවන ලදී. 1992 වසර අවසානයේදී සැළකිල්ලට ගනු ලැබූ හිමිකම්පෑම් 24 ක් සඳහා ගෙවීම් කිරීම පසුවට කල්තබන ලදී. එයට හේතුව හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව සහභාගිත්ව ණය දෙන ආයතන විසින් පුනරුත්ථාපන වැඩපිළිවෙලවල් දියත් කිරීම ආරම්භ කිරීම හෝ හිමිකම්පාන ලද ණය මුදල් සම්බන්ධයෙන් ගෙවීම් කිරීම ණයකරුවන් විසින් නැවත ආරම්භ කිරීම විය.

1992 දෙසැම්බර් 31 දිනට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස්කරගන්නා ලද වාර මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 27 ක් වන අතර, පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් රුපියල් දශ ලක්ෂ 7 ක් විය.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත III (සුමක III) ණය යෝජනා ක්‍රමය.**

1988 ජූලි මාසයේදී ආරම්භ වූ සුමක III ණය යෝජනා ක්‍රමය යටතේ, 1992 වර්ෂය අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 1,955 ක වටිනාකම ඇති ණය ආවරණ සහතික පත්‍ර

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික

| යෝජනා ක්‍රම සහ වර්ෂ / ශීර්ෂය | | සුළු පරිමාණ කර්මාන්ත 1992 | | සුමක I 1992 | | |
|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව |
| 1.1 | ප්‍රදානය කරන ලද ණය | 767 | 31.20 | 1670 | 286.10 | 2531 |
| 1.2 | සහතික කරන ලද ණය | 767 | 23.40(ආ) | 1670 | 157.50(ඇ) | 2531 |
| 2.1 | සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය | 597 | 22.90 | 1216 | 178.83 | 707 |
| 2.2 | ඉවත් කර ගන්නා ලද ණය හෝ අවලංගු වූ ණය සහතික | 90 | 4.89 | 112 | 30.38 | 276 |
| **හිමිකම්පෑම්** | | | | | | |
| 3.1 | ලැබූ මුළු හිමිකම්පෑම් | 88 | 4.32(උ) | 334 | 75.24(උ) | 180 |
| 3.2 | ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් | | 2.42 | | 33.02 | |
| 3.3 | හිමිකම්පෑම් සමථයකට පත්කිරීම් | | | | | |
| 3.3.1 | සම්පූර්ණයෙන් ගෙවීම් කළ හිමිකම්පෑම් | 63 | 1.68 | 224 | 17.84 | 99 |
| 3.3.2 | අර්ධ ගෙවීම් කළ හිමිකම්පෑම් | 1 | 0.00(29) | 27 | 2.11 | 5 |
| 3.3.3 | ප්‍රතික්ෂේප කළ හිමිකම් පෑම් | 7 | 0.22 | 28 | 4.78 | 39 |
| 3.3.4 | හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද ණය (ඒ) | 16 | 0.24 | 37 | 2.03 | 2 |
| 3.3.5 | සලකා බැලීම කල් තබන ලද හිමිකම්පෑම් (ඔ) | 1 | 0.27 | 12 | 3.04 | 25 |
| 3.3.6 | තීරණ ගෙන නොමැති හිමිකම්පෑම් (ඔ) | | | 6 | 1.06 | 5 |
| 3.3.7 | ඉවත්කර ගන්නා ලද හිමිකම්පෑම් (ඔ) | | | | | 5 |
| 4.1 | නොපියවන ලද ණය මුදල් | 10 | 0.58(එ) | 61 | 9.68(එ) | 1405 |
| 4.2 | (එයින් හිඟහිටි ණය) | 10 | 0.58 | 61 | 9.68 | 897 |
| 4.3 | ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම | 10 | 0.44(ආ) | 61 | 5.81(ඇ) | 1405 |
| 5 | රක්ෂකරන ලද වාර මුදල් | | 1.00 | | 12.07 | |
| 6 | පශ්චාත් හිමිකම් අයකර ගැනීම් | | 0.61 | | 5.44 | |

(අ) ජාතික සංවර්ධන බැංකු විසින් සුමක සඩ යෝජනා ක්‍රමයට මාරු කරන ලද ණය හැර
(ආ) නොපියවූ ණය ශේෂයන්ගෙන් සියයට 75 ක ප්‍රමාණය.
(ඇ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 0.4 ක උපරිමයකට යටත්ව නොපියවූ ණය ශේෂයෙන් සියයට 60 ක ප්‍රමාණය.
(ඈ) රුපියල් දශ ලක්ෂ 2.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 0.8 ක් සහ රුපියල් දශ ලක්ෂ 2.0 - 4.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 1.2 ක උපරිමයකට යටත් වූ හිඟ ණය මුදල්හි සියයට 60 ක ප්‍රමාණය.
(ඉ) ව්‍යාපෘතියක් සඳහා රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යත්ව රුපියල් දශ ලක්ෂ 2.0, රුපියල් දශ ලක්ෂ 2.0-3.0 සහ රුපියල් දශ ලක්ෂ 3.0-4.0 ක් වූ ණය සඳහා පිළිවෙළින් සියයට 80, 60 සහ 40 ප්‍රමාණය
(ඊ) ව්‍යාපෘතියක් සඳහා රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 0.5, රුපියල් දශ ලක්ෂ 0.5-1.0, රුපියල් දශ ලක්ෂ 1.0-2.0 සහ රුපියල් දශ ලක්ෂ 2.0-8.0 ක් වූ ණය සඳහා පිළිවෙළින් සියයට 90, සියයට 80, සියයට 70 සහ සියයට 60 ක්.
(උ) ගෙවීම් පැහැර හැර ඇති ණය මුදල් එකතු වූ පොළියත් සමඟ.
(ඌ) රුපියල් 4504.75 ක හිමිකම්පෑම් ගෙවා ඇත.
(එ) අයකරගත් ණය වාරික හැර
(ඒ) 2.1 යටතේ අඩංගු වී ඇත.
(ඔ) 4.1 යටතේ අඩංගු වී ඇත.

2.5 සංඛ්‍යා සටහන

## යෝජනා ක්‍රමයන්හි 1992.12.31 දිනට පැවති සාරාංශය

(වටිනාකම රුපියල් දශ ලක්ෂ)

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක)

| සුමක II | | | සුමක III | | | | සුමක IV | |
|---|---|---|---|---|---|---|---|---|
| 1991 | 1992 | | 1991 | | 1992 | | 1992 | |
| වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1392.54 | 2531 | 1392.54 | 3883 | 2373.20 | 3129 | 1955.04(අ) | 2621 | 1915.99 |
| 713.63 | 2531 | 713.63(ඇ) | 3883 | 1660.65(ඉ) | 3129 | 1312.18(ඉ) | 2621 | 1137.52(ඊ) |
| 232.78 | 1111 | 441.65 | 48 | 17.50 | 227 | 99.36 | 6 | 1.26 |
| 142.24 | 340 | 167.37 | 208 | 101.70 | 267 | 202.09 | 22 | 11.62 |
| 80.55(උ) | 204 | 84.71(උ) | 11 | 5.02(උ) | 36 | 14.54(උ) | 1 | 0.14(උ) |
| 45.71 | | 49.87 | | 3.22 | | 12.74 | | 0.14 |
| 23.26 | 113 | 25.94 | 6 | 1.60 | 16 | 3.45 | | |
| 0.71 | 5 | 0.71 | | | | | | |
| 9.08 | 39 | 9.08 | 1 | 0.56 | 5 | 1.70 | | |
| 0.58 | 2 | 0.58 | | | | | | |
| 7.12 | 24 | 7.51 | 2 | 0.46 | 3 | 0.40 | | |
| 1.69 | 21 | 5.16 | 2 | 0.59 | 12 | 7.18 | 1 | 0.14 |
| 2.26 | | | | | | | | |
| 422.71(එ) | 923 | 287.27(එ) | 3620 | 1825.42(එ) | 2614 | 1128.53(එ) | 2592 | 840.75(එ) |
| 184.05 | 678 | 163.37 | 395 | 36.37 | 893 | 73.16 | | |
| 265.49(ඇ) | 923 | 164.76(ඇ) | 3620 | 1284.42(ඉ) | 2614 | 759.41(ඉ) | 2592 | 579.09(ඊ) |
| 25.42 | | 27.17 | | 18.79 | | 27.96 | | 2.58 |
| 3.11 | | 6.98 | | 0.00 | | 0.49 | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සුමක II, III සහ IV ණය සහතික ක්‍රම

| කර්මාන්ත | සුමක - II, III සහ IV 1982 - 1992 | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | % | ණය ප්‍රමාණය | % | සහතික කරන ලද ණය ප්‍රමාණය | % | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව |
| 1. ආහාර වර්ග සැකසීම | 2090 | 25.2 | 1,531,745 | 24.0 | 773,945 | 24.0 | 4 |
| 2. වෙනත් කෘෂිකර්මාන්ත | 187 | 2.3 | 105,635 | 1.7 | 57,941 | 1.8 | 1 |
| 3. රබර් නිෂ්පාදන | 197 | 2.4 | 214,134 | 3.4 | 108,974 | 3.4 | 0 |
| 4. ලෝහ නිෂ්පාදන | 727 | 8.8 | 439,815 | 6.9 | 223,830 | 6.9 | 3 |
| 5. ඉදිකිරීම් ද්‍රව්‍ය | 594 | 7.2 | 375,996 | 5.9 | 222,833 | 6.9 | 3 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු | 92 | 1.1 | 138,528 | 2.2 | 54,475 | 1.7 | 0 |
| 7. දැව කර්මාන්ත | 531 | 6.4 | 276,480 | 4.3 | 154,114 | 4.8 | 2 |
| 8. ඇඟළුම් | 610 | 7.4 | 609,015 | 9.6 | 309,718 | 9.6 | 1 |
| 9. රෙදිපිළි | 214 | 2.6 | 262,071 | 4.1 | 116,064 | 3.6 | 0 |
| 10. අළුත්වැඩියා කිරීමේ වැඩපොලවල් | 314 | 3.8 | 172,648 | 2.7 | 94.938 | 2.9 | 2 |
| 11. වෙනත් | 2725 | 32.9 | 2,246,717 | 35.2 | 1,107,170 | 34.3 | 9 |
| එකතුව | 8281 | 100.0 | 6,372,784 | 100.0 | 3,224,002 | 100.0 | 25 |

DISCARDED

**2.6 - සංඛ්‍යා සටහන**

## කර්මාන්ත අනුව වර්ගීකරණය - 1992.12.31 දිනට

(රුපියල් '000)

| සමූහ - III 1992 | | | | | සමූහ - IV 1992 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| % | ණය ප්‍රමාණය | % | සහතික කරන ලද ණය ප්‍රමාණය | % | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | % | ණය ප්‍රමාණය | % | සහතික කරන ලද ණය ප්‍රමාණය | % |
| 16.0 | 5,245 | 16.5 | 3,356 | 16.8 | 565 | 21.5 | 377,333 | 19.7 | 225,526 | 19.8 |
| 4.0 | 306 | 1.0 | 245 | 1.2 | 49 | 1.9 | 24,074 | 1.3 | 17,024 | 1.5 |
| 0.0 | 0 | 0.0 | 0 | 0.0 | 46 | 1.8 | 49,687 | 2.6 | 26,855 | 2.4 |
| 12.0 | 1,485 | 4.7 | 1,188 | 6.0 | 212 | 8.1 | 126,563 | 6.6 | 75,095 | 6.6 |
| 12.0 | 2,612 | 8.3 | 1,730 | 8.7 | 130 | 5.0 | 79,533 | 4.2 | 54,233 | 4.8 |
| 0.0 | 0 | 0.0 | 0 | 0.0 | 31 | 1.2 | 64,411 | 3.4 | 24,807 | 2.2 |
| 8.0 | 2,210 | 7.0 | 1,768 | 8.9 | 151 | 5.8 | 75,505 | 3.9 | 54,547 | 4.8 |
| 4.0 | 3,000 | 9.5 | 1,600 | 8.0 | 188 | 7.2 | 184,877 | 9.6 | 92,701 | 8.1 |
| 0.0 | 0 | 0.0 | 0 | 0.0 | 82 | 3.1 | 102,429 | 5.3 | 51,403 | 4.5 |
| 8.0 | 1,725 | 5.5 | 1,380 | 6.9 | 101 | 3.9 | 48,689 | 2.5 | 35,753 | 3.1 |
| 36.0 | 15,048 | 47.5 | 8,686 | 43.5 | 1066 | 40.5 | 782,888 | 40.9 | 479,574 | 42.2 |
| 100.0 | 31,631 | 100.0 | 19,953 | 100.0 | 2621 | 100.0 | 1,915,989 | 100.0 | 1,137,518 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

3,129 ක් නිකුත් කොට ඇත. සහභාගිත්ව ණය දෙන ආයතනයන්හි අනුමැතියට යටත්ව ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) විසින් ගනු ලැබූ තීරණයකට අනුව සුමක III ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත කළ සමහර ප්‍රතිමූල්‍ය ණය මුදල් සුමක IV ණය යෝජනා ක්‍රමයට මෙම වර්ෂය තුළදී මාරු කරනු ලැබීය. තීරණයට අනුකූලව මහ බැංකුව සුමක IV ණය යෝජනා ක්‍රමයට ණය සහතික පත්‍ර මාරු කරුනු ලැබීය. 1991 (3,883) වර්ෂය හා සසඳන විට 1992 (3,129) වර්ෂය තුළදී ණය ආවරණ සහතික පත්‍රවල අඩුවීමට හේතුවූයේ එයයි.

මෙම යෝජනා ක්‍රමය යටතේ සහතික කරණ ලද ණය 3,129 න් රුපියල් දශ ලක්ෂ 99 ක වටිනාකම ඇති ණය ආවරණ සහතික 227 ක් සඳහා වන ණය මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කොට ඇති අතර, රුපියල් දශ ලක්ෂ 202 ක වටිනාකම ඇති ණය ආවරණ සහතික 267 ක් මහ බැංකුව විසින් සහභාගිත්ව ණය දෙන ආයතන වලට නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. 1992 දෙසැම්බර් 31 දිනට රුපියල් දශ ලක්ෂ 13 ක වටිනාකමින් යුත් මහ බැංකුවේ වගකීමක් සහිත හිමිකම්පෑම් 36 ක් ලැබුණි, ඉන් රුපියල් දශ ලක්ෂ 3.4 ක් සඳහා වන හිමිකම්පෑම් 16 ක් සමථයකට පත්කරනු ලැබූ ඇතර රුපියල් දශ ලක්ෂ 1.7 ක් සඳහා වන හිමිකම්පෑම් 5 ක් ප්‍රතික්ෂෙප කරනු ලැබීය. හිමිකම්පෑම් 3 ක් සඳහා ගෙවීම් සිදුකිරීම එම ණය මුදල් ලබාගත් ණයකරුවන් විසින් නැවත ගෙවීම් සිදුකිරීම නිසා අත්හිටුවනු ලැබුණි. 1992 දෙසැම්බර් අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 759 ක උපරිම වගකීමක් සහිත රුපියල් දශ ලක්ෂ 1,128 ක වටිනාකමින් යුත් ණය මුදල් 2,614 ක් ක්‍රියාත්මක වෙමින් තිබුණි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත IV (සුමක IV) ණය යෝජනා ක්‍රමය.

මුදල් මණ්ඩලයේ අනුමැතිය යටතේ 1991 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද සුමක IV ණය යෝජනා ක්‍රමය 1992 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක විය. 1992 වසර අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 1916 ක වටිනාකම ඇති ණය ආවරණ සහතික පත්‍ර 2,621 ක් නිකුත් කොට ඇත. මෙම ණය මුදල් සඳහා මහ බැංකුවේ වගකීම රුපියල් දශ ලක්ෂ 1,137 ක් විය. වර්ෂය තුළ දී රුපියල් දශ ලක්ෂ 1.3 ක වටිනාකම ඇති ණය ආවරණ සහතික 6 ක් සඳහා වන ණය මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කොට ඇති අතර, ණය ආවරණ සහතික 22 ක් මහ බැංකුව විසින් සහභාගිත්වය ණය දෙන ආයතන වලට නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම නිසා ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. 1992 වසර අවසානය වනවිට ණය මුදල් 2,592 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙම ණය මුදල්වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 841 ක් වූ අතර මහ බැංකුවේ වගකීම රුපියල් දශ ලක්ෂ 579 ක් විය.

අනෙකුත් සුමක ණය යෝජනා ක්‍රමයන්හිදී මෙන් නොව, සුමක IV ණය යෝජනා ක්‍රමයෙහිදී ඇප ආවරණ මුදල් වාර්ෂිකව ගණනය කරනු ලැබීය. 1992 වර්ෂය අවසානයට රැස්කරන ලද මුළු ඇප වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2.6 ක් විය. 1992 අවසානය වන විට මෙම ණය යෝජනා ක්‍රමයෙහි ප්‍රගතිය 2.6 සංඛ්‍යා සටහනෙහි සංක්ෂිප්ත කොට දක්වා ඇත.

සුමක II, III සහ IV යෝජනා ක්‍රම යටතේ මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘතීන්හි කර්මාන්ත අනුව ණය වර්ගීකරණය 2.6 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

බස්රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය (බ. මි. ණ.)

මගී ප්‍රවාහණය සඳහා පෞද්ගලික බස්රථ ධාවකයින්ට සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ප්‍රදානය කරනු ලබන ණය මුදල් ආවරණය කිරීම සඳහා වූ මෙම ණය සහතික ක්‍රමය මහ බැංකුව විසින් 1990 නොවැම්බර් මාසයේදී හඳුන්වා දෙන ලදී. 1992 වර්ෂය අවසානය වනවිට මෙම ණය සහතික ක්‍රමය වෙනුවෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම සඳහා ජාතික සංවර්ධන බැංකුව වෙන්කර තිබූ සම්පත් සියල්ලම ප්‍රයෝජනයට ගෙන තිබූ හෙයින් එතැන් සිට

මෙම ණය සහතික ක්‍රමය ක්‍රියාත්මක වීම අවසන් විය. මෙම ණය සහතික ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 871 ක මහ බැංකුවේ වගකීමක් සහිත මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,097 ක්වූ ණය මුදල් 1,928 ක් නිකුත් කොට ඇත. 1992 වසර අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 4.8 ක් වටිනා ණය මුදල් 9 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 59 ක් වටිනා ණය ආවරණ සහතික පත්‍ර 104 ක් මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් අනුගමනය නොකිරීම හේතුවෙන් අහෝසි වී හෝ මහ බැංකුව විසින් ඉවත්කර ගැනීම හෝ සිදුවිය.

### 2.7 - සංඛ්‍යා සටහන

### බස්රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය - 1992.12.31 දිනට සාරාංශය

(වටිනාකම රුපියල් දශ ලක්ෂ)

| | ශීර්ෂය | 1991.12.31 දිනට | | 1992.12.31 දිනට | |
|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1.1 | ප්‍රදානය කරන ලද ණය | 1511 | 347.94 | 1928 | 1096.57 |
| 1.2 | සහතික කරන ලද ණය | 1511 | 674.82(අ) | 1928 | 870.62(අ) |
| 2.1 | සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති ණය | 2 | 0.96 | 9 | 4.78 |
| 2.2 | ඉවත් කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික | 16 | 7.35 | 104 | 59.51 |
| හිමිකම්පෑම් | | | | | |
| 3.1 | ලැබූ සම්පූර්ණ හිමිකම්පෑම් | | | 5 | 3.17(ආ) |
| 3.2 | මහ බැංකුවේ වගකීම | | | | 1.94 |
| 3.3 | සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් | | | | |
| | 3.3.1 සම්පූර්ණයෙන්ම සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් | | | | |
| | 3.3.2 අඩක් සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් | | | 1 | 0.2 |
| | 3.3.3 ප්‍රතික්ෂේප කරන ලද හිමිකම්පෑම් | | | 1 | 0.6 |
| | 3.3.4. කල් තබන ලද හිමිකම්පෑම් (ඇ) | | | | |
| | 3.3.5. තීරණයක් නොගත් හිමිකම්පෑම් (ඇ) | | | 3 | 1.82 |
| 4.1 | ගෙවා නොමැති ණය | 1493 | 679.36(ඇ) | 1810 | 903.5(ඇ) |
| 4.2 | ගෙවා නොමැති ණය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් | 1493 | 541.17(අ) | 1810 | 716.79(අ) |
| 5.0 | රැස්කරන ලද වාර මුදල් | | 3.08 | | 8.9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2.0, රුපියල් දශ ලක්ෂ 2.0 - රුපියල් දශ ලක්ෂ 3.0 සහ රුපියල් දශ ලක්ෂ 3 - රුපියල් දශ ලක්ෂ 4 දක්වා වූ ණය සම්බන්ධයෙන් පිළිවෙලින් 80%, 60% සහ 40% ප්‍රමාණයන් මත.

(ආ) එහිදී අයකරගත් පොළිය ඇතුලත්ව, නොගෙවා පැහැර හරින ලද ණය ප්‍රමාණය.

(ඇ) අයකරගත් ණය වාරික හැර.

(ඇ) අංක 4.1 යටතේ ඇතුලත් කරන ලදී.

1992 වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 1.9 ක් සඳහා මහ බැංකුව වගකීම භාරගනු ලැබූ රුපියල් දශ ලක්ෂ 3.17 ක් වටිනා ණය මුදල් 5 ක් සඳහා හිමිකම්පෑම් ඉදිරිපත් කරනු ලැබිය. මේවායින් රුපියල් දශ ලක්ෂ 0.2 ක් සඳහා හිමිකම්පෑමක් පියවා ඇති අතර, රුපියල් දශ ලක්ෂ 0.6 ක් සඳහා වූ හිමිකම්පෑම් අයදුම්පතක් සඳහා ගෙවීම් ප්‍රමාද කරනු ලැබීය. රුපියල් දශ ලක්ෂ 1.8 වටිනා ඉතිරි අයදුම්පත් 3 සලකා බලමින් පැවතුනි.

මෙම ණය සහතික ක්‍රමය යටතේ ණයකරුවන් 1,816 ක් විසින් නව බස්රථ 1,911 ක් මගී ප්‍රවාහණය සඳහා පොදු මගී ප්‍රවාහණ සේවාවට එක් කරන ලදී. මෙම ණය සහතික ක්‍රමයෙහි වැදගත්ම ලක්ෂණය වූයේ නව බස්රථ 1,463 ක් හිමි නව බස්රථ හිමියන් 1,420 ක් හඳුන්වා දීමයි. දැනට සිටින බස්රථ හිමියන් 396 ක් පමණක් මෙම ණය සහතික ක්‍රමය යටතේ නව බස්රථ 448 ක් මගී ප්‍රවාහණයට යොදවන ලදී. මුළු ණයකරුවන්ගෙන් 1,031 ක් නැතහොත් සියයට 56 ක් බස්රථ එකක් පමණක් හිමි අය වශයෙන් මගී ප්‍රවාහන සේවාවේ යෙදී සිටියහ. මේ අනුව බස්රථ අයිතිය පුළුල් කිරීම සහ ව්‍යාප්ත කිරීම වෙනුවෙන් මෙම ණය සහතික ක්‍රමය දායක වී ඇත.

1992 දෙසැම්බර් 31 දින වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ එක්රැස් කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8.9 ක් විය.

අඩු ආදායම් නිවාස වැඩසටහන (අ.ආ.නි.වැ.) අදියර iv

නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන අඩු ආදායම් ලබන කුටුම්භයන්ගේ නිවාස තත්ත්වය වැඩිදියුණු කිරීමේ පරමාර්ථයෙන් මහ බැංකුව විසින් මුදල් නීති පනතේ (මු. නී. ප.) 106(1) වගන්තිය අනුව අඩු ආදායම් නිවාස වැඩසටහනෙහි (අ.ආ.නි.වැ.) අදියර iv ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිමූල්‍ය ණය ක්‍රමයක් 1992 ජූලි මාසයේදී ස්ථාපිත කරන ලදී. මෙම ක්‍රමය යටතේ මහ බැංකුව ප්‍රධාන ණය දෙන ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමූල්‍ය ප්‍රදානය කරනු ලබන්නේ එක්සත් ජනපද ආණ්ඩුවේ නිවාස ණය වැඩසටහනෙහි අදියර iv මගින් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ප්‍රදානය කරනු ලැබූ ණය මුදලක් මාර්ගයෙනි. අ.ආ.නිවැ. අදියර iv යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගිවිසුමකට එළඹ ඇති උප ප්‍රධාන ණය දෙන ආයතන (උ. ප්‍ර. ණ. ආ.) හෝ සෘජුමූලික ණය දෙන්නන් වශයෙන් නම් කර ඇති සහභාගිත්ව ණය දෙන ආයතන වලට මෙම අරමුදල් ලබා ගැනීමට හැකි විය. 1992 වසර අවසානය වනවිට ලංකා බැංකුව, මහජන බැංකුව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ සීමාසහිත සෙලාන් බැංකුව මහ බැංකුව සමඟ මෙවැනි ගිවිසුම් වලට එළඹ තිබුණි.

උප ප්‍රධාන ණය දෙන්නන් විසින් (උ.ප්‍ර.ණ.) සුදුසුකම් ලබන කුටුම්භයන්ට සෘජුවම හෝ සමූපකාර ග්‍රාමීය බැංකු, සකසුරුවම් සහ සමූපකාර ණය දෙන සංගම්, දේපළ සංවර්ධන සමාගම් හෝ රක්ෂණ සමාගම් වැනි මූලික ණය දෙන්නන්ට මෙම අරමුදල් ණය වශයෙන් ප්‍රදානය කරනු ලැබේ. මූලික ණය දෙන්නන් මෙම අරමුදල් ණය වශයෙන් සුදුසුකම් ලබන කුටුම්භයන්ට ප්‍රදානය කළ යුතුවිය. 1992 වර්ෂය තුළදී අනුගමනය කරනු ලැබූ තෝරා ගැනීමේ නිර්නායකයන් අනුව මසකට රුපියල් 2,960/- කට වඩා අඩු ආදායම් ලබන ග්‍රාමීය කුටුම්භයන් සහ මසකට රුපියල් 3,700/- කට වඩා අඩු ආදායම් ලබන නාගරික කුටුම්භයන්ට නිවාස ඉදිකිරීම සඳහා ඉඩමක් මිළදී ගැනීමට, දැනට පවතින නිවසකට අළුතෙන් කොටසක් එකතු කිරීමට හෝ වැඩිදියුණු කිරීමට සහ පවතින නිවාස අළුත්වැඩියා කිරීමට හෝ නිවාස වලට අවශ්‍ය පහසුකම් ලබාගැනීමේ කාර්යයන් සඳහා ණය ලබාගැනීමට ඉඩකඩ සලසනු ලැබීය.

මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය මුදාහැරීම 1992 ඔක්තෝබර් මැද භාගයේ දී ආරම්භ විය. 1992 දෙසැම්බර් මාසය අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 27 ක වටිනාකමින් යුත් නිවාස ණය 4273 ක් සඳහා ප්‍රතිමූල්‍ය අනුමත කරනු ලැබීය.

## 2.8 සංඛ්‍යා සටහන

### අනුමත කරන ලද හා මුදාහරින ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය 1992.12.31 දිනට සාරාංශය

(වටිනාකම රුපියල් දශ ලක්ෂ)

| | අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය ණය | | මුදාහරින ලද ප්‍රතිමූල්‍ය ණය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1 ලංකා බැංකුව | 4,158 | 24.50 | 2,990 | 7.6 |
| 2 සීමාසහිත හැටන් නැෂනල් බැංකුව | 68 | 1.2 | - | - |
| 3 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 47 | 1.7 | - | - |
| 4 මහජන බැංකුව | - | - | - | - |
| 5 සීමාසහිත සෙලාන් බැංකුව | - | - | - | - |
| එකතුව | 4,273 | 27.40 | 2,990 | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**සුමක හා බම්ණ. ණය සහතික අරමුදල් ආයෝජනය කිරීම.**

1988 ජූලි මාසයේදී ආරම්භ කළ සුමක හා බ.මි.ණ. ණය සහතික අරමුදල් ප්‍රාථමික හා ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලෙහි ආයෝජනය කිරීම 1992 වසර තුළදී ද නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබිය. 1992 වසර අවසානය වනවිට අරමුදල් දෙකෙහි පැවති ආයෝජිත මුදල හා වාර මුදල් එකතුව කිරීම, රුපියල් දශ ලක්ෂ 425 ක් විය. වර්ෂය තුළ මෙම ආයෝජන වලින් උපයන ලද පොළී ආදායම රුපියල් දශ ලක්ෂ 48.9 ක් විය.

**ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙල.**

වර්ෂය තුළදී සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව විසින් ව්‍යවසායකත්ව සංවර්ධන කිරීමේ වැඩසටහන් 3 ක් පවත්වන ලදී. එක් වැඩසටහනක්, පාසැල් හැර යන්නන් සහ ජනසවි ලාභීන් ස්වයං රැකියා අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණෙන් පුත්තලම් දිස්ත්‍රික්කයේ පැවැත් වූ අතර, එයට 110 ක් දෙනා සහභාගි විය. තාක්ෂණය හා කළමනාකරණ දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් දෙකක් අනුරාධපුර හා මහියංගනයේදී පවත්වන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ඇඟළුම් කර්මාන්තයන්හි නියැලි සේවකයින් අතුරින් තෝරාගන්නා ලද සේවකයින් 60 දෙනෙකු සහ බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගන ප්‍රදේශයෙහි ලුහු ඉංජිනේරු කර්මාන්තයෙහි නියැලි කාර්මිකයින් අතුරින් තෝරාගත් 45 දෙනෙකු මෙම වැඩසටහන් දෙකට සහභාගී විය.

මෙම වැඩසටහන් ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහ පුත්තලම, අනුරාධපුර සහ බදුල්ල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල සහයෝගය ඇතිව පවත්වන ලදී.

**පසුවිපරම් කිරීම සහ ව්‍යාපෘති පරීක්ෂණය.**

අවශ්‍ය අවස්ථාවන්හි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගැනීමේ අරමුණ පෙරදැරි කොටගෙන සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් සමථයකට පත්කිරීම සඳහා ද සුමක ණය සහතික ක්‍රම යටතේ වූ ව්‍යාපෘති 230 ක් 1992 වර්ෂය තුළදී පරීක්ෂාවට ලක්විය. මෙම ව්‍යාපෘති වලින් වැඩි සංඛ්‍යාවක් කොළඹ, ගාල්ල, පුත්තලම, ගම්පහ, අනුරාධපුර සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හි පිහිටුවා තිබුණි.

## ග්‍රාමීය ණය

1992 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ ආයතන මගින් අරමුදල් සපයන ලද සහන සදහන් ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ණය මෙහෙයුම් ආයතනය වශයෙන් තවදුරටත් කටයුතු කළේය.

1. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්) මගින් අරමුදල් සපයන ලද කෑගල්ල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.

2. ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) මගින් අරමුදල් සපයන ලද කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය (දෙවන අදියර).

3. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය.

4. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද මැදරට නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතිය.

5. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය.

6. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද දකුණු පළාත ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.

7. ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන වයඹ පළාත ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය.

විගැහි දශ ලක්ෂ 1.55 කින් යුත් කෑගල්ල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රමය 1989 ඔක්තෝබර් මස 15 දිනදී ආරම්භ කළ අතර, එය 1993 ජූනි මස 30 දින අවසාන වීමට නියමිතය. මෙම යෝජනා ක්‍රමය යටතේ මුදාහරිනු ලබන ණය සඳහා සියයට 100 ක ප්‍රතිමූල්‍ය පහසුකම් ලැබේ. ඒ අනුව මධ්‍යකාලීන කෘෂිකාර්මික ණය සහ ග්‍රාමීය කර්මාන්ත ණය සඳහා ව්‍යාපෘති අරමුදලින් සියයට 75 දක්වා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයෙන අතර ඉතිරි සියයට 25 ප්‍රතිමූල්‍ය, ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදලින් සපයනු ලැබේ. වගා ණය සම්බන්ධ ප්‍රතිමූල්‍ය ප්‍රමාණයෙන් සියයට 50 ක් යෝජනා ක්‍රම අරමුදලින් සැපයෙන අතර ඉතිරි සියයට 50 මහ බැංකු අරමුදලින් සැපයෙනු ඇත.

ව්‍යාපෘති බල ප්‍රදේශීයේ ගොවින්ට අවශ්‍ය පුහුණුවීම්, උපකාරක සේවා හා ද්වීරෝද ට්‍රැක්ටර් මිලදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලබන, කිරිඳිඔය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතියේ, සහභාගීත්ව ණය දෙන ආයතන වශයෙන් ලංකා බැංකුව, මහජන බැංකුව හා හම්බන්තොට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව ද ක්‍රියා කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ 1992 දෙසැම්බර් 31 වැනි දිනට රුපියල් දශ ලක්ෂ 71.8 ක් මුදාහැර ඇති අතර 1992 වර්ෂය තුළදී කළ මුදාහැරීම් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 15.8 ක් විය.

1992 වර්ෂයෙහිදී එනම් කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ සිව්වන වසරෙහිදී, ක්ෂේත්‍ර සංවර්ධනය, පැල තවාන් සංවර්ධනය සහ කර්මාන්තශාලා පුනරුත්ථාපනය සඳහා ණයදෙන ආය්තන විසින් ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 23.2 ක ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදෙන ලදී. 1992 වසර අවසාන වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කළ මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 43.4 ක් විය. 1992 වසර තුළදී නව ණයදෙන ආයතන දෙකක් එනම් බදුල්ල සහ රත්නපුර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මෙම ණය යෝජනා ක්‍රමයට ඇතුළත් කරගන්නා ලදී.

බදුල්ල, මහනුවර, කෑගල්ල, මාතලේ සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි නිත්‍ය බෝගවල, විශේෂයෙන්ම සුළු අපනයන බෝග සහ ආහාර බෝග වගාවන්හි නිෂ්පාදනය ඉහළ නැංවීමත්, ඒවායේ වාණිජමය මට්ටම වැඩිදියුණු කිරීමත් අරමුණු කොට ගෙන ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය අරමුදල් වලින් ගොවීන්ට ණය පහසුකම් සැපයීම සඳහා නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය සැලසුම් කොට ඇත. ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ලංකා වාණිජ බැංකුව සහ මහනුවර, කෑගල්ල, මොණරාගල, බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිවන ණය දෙන ආයතන වශයෙන් කටයුතු කරනු ලැබේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ නිත්‍ය බෝග සම්බන්ධ ගොවිපල බෝග සංවර්ධනය, පුද්ගලික පැල තවාන් සංවර්ධනය, ගොවිපලෙහිදීම අස්වනු ලබාගැනීම හා සැකසීමේ කටයුතු සඳහා ණය පහසුකම් සැපයේ. 1992 අග වන විට මහ බැංකුව විසින් මුදාහැර ඇති ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 17.2 කි. මෙම වර්ෂය තුළදී පමණක් රුපියල් දශ ලක්ෂ 11.6 ක් මුදාහරින ලදී.

විපතටපත් පුද්ගලයන් සහ හානියට පත් දේපොල පුනරුත්ථාපනය කිරීම සඳහා කෘෂිකර්මය, සත්වපාලනය, ධීවර කර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර යන අංශවලට අදාල ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන මූල්‍යකරණය කිරීම මගින් එම අංශවල පුනර්ජීවනයක් ඇති කිරීමත්, ඒ මගින් නිෂ්පාදනය සහ ආදායම් උත්පාදනය ඉහළ නැංවීමත්, රැකියා අවස්ථා පුළුල් කිරීමත් කෘෂිකාර්මික පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමයේ අරමුණ වේ. යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, වවුනියා ඇතුළු උතුරු පළාතේ හා අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය ඇතුළු නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක 08 ද, අනුරාධපුර, හම්බන්තොට, මොණරාගල, පොළොන්නරුව, පුත්තලම ඇතුළු එම පළාත් දෙකට යාබද දිස්ත්‍රික්කද ව්‍යාපෘති බලප්‍රදේශය ලෙස ආවරණය වේ. 1991 ඔක්තෝබර් මාසයේදී පුනරුත්ථාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස පිහිටුවන ලද ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, 1992 වසර තුළ සහභාගි වන බැංකු ආයතන විසින් දෙන ලද උප ණය 626 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 31.5 ක ප්‍රතිමූල්‍ය සපයා ඇත. ණය අවශ්‍ය පුද්ගලයන්ට අවබෝධයක් ලබාදීම සඳහා විශාල ප්‍රචාරක ව්‍යාපෘති වැඩපිළිවෙලක් ව්‍යාපෘති ඒකකය මගින් පවත්වන ලදි. ව්‍යාපෘති බලප්‍රදේශය තුළ සිටින බැංකු නිලධාරීන්ට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම සහ ණය බෙදාහැරීමේ අවබෝධය ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙන ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය සමඟ එක්ව පුහුණු වැඩමුළු 07 ක් ව්‍යාපෘති ඒකකය මගින් පවත්වන ලදි.

ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) විසින් අරමුදල් සපයනු ලබන දකුණු පළාත ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරෙන ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන මෙහෙයුම් ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කරනු ලැබේ. මේ යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 'චාර්ලි මවුන්ට්' කාර්මික ජනපදයේ පිහිටුවනු ලබන කුඩා / මධ්‍යම පරිමාන කාර්මික ව්‍යවසායයන් සඳහා සහ දකුණු පළාතේ ආරම්භ කරනු ලබන කුඩා / මධ්‍යම පරිමාණ ග්‍රාමීය ව්‍යවසායයන් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

වයඹ පළාත ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපද (ඇ.එ.ජ.) ඩොලර් දශ ලක්ෂ 30.0 ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගැනීම සඳහා, ශ්‍රී ලංකා රජය එම බැංකුව සමඟ මෑතකදී ගිවිසුමකට එළඹෙන ලදි. මෙම ව්‍යාපෘතිය 1992 සිට 1998 දක්වා වසර 07 ක් තුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරෙන අ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2.7 ක් පමණ වන ණය යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන මෙහෙයුම් ආයතනය වන්නේ ශ්‍රී ලංකා මහබැංකුවයි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ළිං කැණීම, උස්සාන වාරිමාර්ග යෝජනා ක්‍රම සහ ගැමි කාන්තාවන් ආරම්භ කරනු ලබන කුඩා පරිමාණ ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලබන අතර ණය මුදල් මුදාහැරීම මෙතෙක් ආරම්භ කර නොමැත.

1992 වර්ෂය තුළදී ද නොකඩවා ක්‍රියාත්මක වුන දේශීය බිල්පත් යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 0.8 ක එක් ප්‍රතිග්‍රහණ ණයවර සීමාවක් අනුමත කිරීමත් ස
දේශීය බිල්පත් යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද මුළු ප්‍රතිග්‍රහණ ණයවර සී

සංඛ්‍යාව 30 ක් විය. තේ දළු සපයන්නන්ට සහ පුද්ගලික තේ කම්හල් හිමියන්ට තේ වගා අංශයේ වාණිජ බැංකු මගින් සහනයක් සැලසීමේ අරමුණින් මෙම යෝජනා ක්‍රමය 1989 දී හඳුන්වා දෙනු ලැබීය. අනතුරුව කිරි මිළදී ගන්නන් හට සහ විකුණන්නන් හට අවශ්‍ය මූල්‍ය පහසුකම් නුවරඑළිය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව මගින් සැපයීම සඳහා මෙම යෝජනා ක්‍රමය ව්‍යාප්ත කරන ලදී.

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු

ඉතිරිකිරීම් සංචලනය, ණය පහසුකම් සැළසීම හා ප්‍රවර්ධන සේවා ව්‍යාප්ත කිරීම තුළින් ග්‍රාමීය ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ කටයුතු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං. බැං)විසින් 1992 වර්ෂය තුළදී තවදුරටත් කරගෙන යන ලදී.

ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා ව්‍යාප්තිය

1992 පෙබරවාරි මාසයේදී අම්පාර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව පිහිටුවීමත් සමඟ වසර අවසානයකට ක්‍රියාත්මකව පැවැති ප්‍රා.ග්‍රා.සං. බැංකු සංඛ්‍යාව 16 ක් දක්වා වැඩිවූ අතර, 1991 අගදී 124ක් වූ මුළු ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා සංඛ්‍යාව 1992 අගදී 156 ක් දක්වා සැලකියයුතු ලෙස වැඩිවිය.

ඉතිරිකිරීම් සංචලනය

1992 වර්ෂය තුලදී ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ඉතිරිකිරීම් සංචලනයෙහි සැලකිය යුතු ප්‍රගතියක් දැක්විය. 1992 වර්ෂය අවසානයට මෙම බැංකුවල මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 666ක් වූ අතර ඉන් සියයට 12ක් ස්ථාවර තැන්පතුද සියයට 88ක් සාමාන්‍ය ඉතුරුම් තැන්පතුද විය. 1992 දී සාමාන්‍ය ඉතුරුම් ගිණුම් සංඛ්‍යාව 570360 ක්ද ස්ථාවර තැන්පතු ගිණුම් 3365 ක්ද, විය. 1992 දී ප්‍රා.ග්‍ර.සං. බැංකුවල තැන්පතු වටිනාකම 1991 ට වඩා සියයට 52 ක වැඩිවීමක් වාර්තා කළ අතර 1992 දී තැන්පතු ගිනුම් සංඛ්‍යාව සියයට 35 ක වැඩිවීමක් වාර්තාකරමින් 573725ක් විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ බැංකු පහසුකම් නොමැති හා බැංකු පහසුකම් අඩු ග්‍රාමීය නොදියුණු ප්‍රදේශවලට බැංකු ශාඛා ව්‍යාප්ත කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධන කටයුතු වර්ධනයවීම, නව ඉතිරිකිරීම් ක්‍රම හඳුන්වාදීම, අනිවාර්ය ඉතිරිකිරීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම හා ඉතිරිකිරීම් පුරුදු වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ ජන හමුවලදී ගනු ලැබූ උත්සාහයනුත්ය.

1991 දී රුපියල් 920/- ක් වූ ඉතිරිකිරීමේ ගිණුමක සාමාන්‍ය වටිනාකම 1992 දී රුපියල් 1030/- දක්වා සියයට 12කින් පමණ වැඩිවූ අතර 1991 දී රුපියල් 18929 ක් වූ ස්ථාවර තැන්පතු ගිණුමක සාමාන්‍ය වටිනාකම 1992 දී රුපියල් 23661/- දක්වා සියයට 25 කින් වැඩිවිය.

ණය කට යුතු

1991 වර්ෂය තුලදී ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් ණය 60315 ක් සඳහා ප්‍රදානය කරන ලද රුපියල් දශ ලක්ෂ 595 ක මුදල් ප්‍රමාණය හා සසඳන කළ 1992 වර්ෂයේදී ණය 71559ක් සඳහා රුපියල් දශ ලක්ෂ 703 ක මුදලක් ප්‍රදානය කරණ ලදී.

1992 වර්ෂය තුලදී ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණයෙන්, කුඩා කර්මාන්ත වාණිජ හා ව්‍යාපාර සඳහා ප්‍රදානය කරන ලද ප්‍රමාණය 1991 දී පැවැති සියයට 23 සිට 1992 දී සියයට 28 දක්වා වැඩිවූ අතර කෘෂිකාර්මික ණයවල ප්‍රමාණය සියයට 46 දක්වා පහත වැටුණි.

උකස් ණය ක්‍රමය යටතේ ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් 1992 වර්ෂය තුලදී ලබාදුන් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 302 ක් වූ අතර මෙය පසුගිය වසර හා සසඳන කළ සියයට

2.9 සංඛ්‍යා සටහන

ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා ව්‍යාප්තිය

| ප්‍රා. ග්‍රා. සං. බැංකුවේ නම | ආරම්භ කළ දිනය | ප්‍රධාන කාර්යාලය | විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව | | | | | | | | 1992 අවසානයට එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1985 | 1986 | 1987 | 1988 | 1989 | 1990 | 1991 | 1992 | |
| 1. කළුතර | 85.07.13 | බුලත්සිංහල | 4 | 3 | 4 | 1 | - | - | 1 | 2 | 15 |
| 2. මාතර | 85.07.28 | මාතර | 5 | 2 | - | 1 | - | - | - | 4 | 12 |
| 3. කුරුණෑගල | 85.08.10 | කුලියාපිටිය | 6 | 4 | 2 | 1 | 1 | 1 | - | 2 | 17 |
| 4. අනුරාධපුරය | 85.08.12 | අනුරාධපුරය | 2 | 4 | 1 | - | - | - | 3 | 1 | 11 |
| 5. හම්බන්තොට | 85.12.13 | අම්බලන්තොට | | 2 | 2 | 2 | - | 1 | - | 1 | 8 |
| 6. කෑගල්ල | 87.02.08 | කෑගල්ල | | | 8 | 1 | 2 | -1+1 | - | 1 | 12 |
| 7. පුත්තලම | 87.07.11 | හලාවත | | | 5 | 1 | - | 2 | 1 | 1 | 10 |
| 8. ගාල්ල | 87.08.17 | ඇල්පිටිය | | | 1 | 7 | 1 | - | - | 3 | 12 |
| 9. මහනුවර | 87.10.03 | මහනුවර | | | 6 | 3 | - | 1 | 1 | 2 | 13 |
| 10. නුවරඑළිය | 88.10.10 | නුවරඑළිය | | | | 1 | 3 | 2 | - | 2 | 8 |
| 11. මොනරාගල | 88.10.11 | බුත්තල | | | | 1 | 2 | 1 | 2 | - | 6 |
| 12. බදුල්ල | 90.10.13 | බදුල්ල | | | | | | 4 | 2 | 3 | 9 |
| 13. පොළොන්නරුව | 91.05.17 | පොළොන්නරුව | | | | | | | 4 | 2 | 6 |
| 14. මාතලේ | 91.06.21 | මාතලේ | | | | | | | 5 | 1 | 6 |
| 15. රත්නපුර | 91.09.30 | රත්නපුර | | | | | | | 4 | 2 | 6 |
| 16. අම්පාර | 92.02.24 | අම්පාර | | | | | | | | 5 | 5 |
| එකතුව | | | 17 | 15 | 29 | 19 | 9 | 12 | 23 | 32 | 156 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

96ක වැඩිවීමකි. උකස් ණය සංඛ්‍යාවද මීට සමාන වැඩිවීමක් පෙන්වූ අතර එය 1992 දී 118,978 ක් විය.

වසර අවසානයේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සතු නොපියවූ ණයවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1116 ක් වූ අතර එය 1991 වසර අවසානයේදී පැවැති නොපියවූ ණය වටිනාකමට වඩා සියයට 38ක වැඩිවීමකි. නොපියවා පැවැති මුළු ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 40 ක් කෘෂිකාර්මික ණයද, සියයට 13 ක් වාණිජ හා ව්‍යාපාර ණයද සියයට 10 ක් සුළු කර්මාන්ත ණයද විය. නොපියවූ ණය වලින් කෘෂිකාර්මික ණයවල ප්‍රතිශතය පසුගිය වසර කිහිපය තුලදී අඩුවීමේ නැඹුරුවක් පෙන්නුම් කළේය. ඒ අනුව 1990 දී සියයට 52 ක් වූ කෘෂිකාර්මික ණය 1992 දී සියයට 40 ක් දක්වා අඩුවිය.

### අනෙකුත් කටයුතු

1992 වසර තුළ ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ළමුන් සඳහා විශේෂ ඉතිරිකිරීම් ක්‍රම හඳුන්වාදුන් අතර, ඉතිරිකිරීම් ගිණුම් හිමියන් සඳහා අතිරේක පහසුකම්ද සපයනු ලැබීය.

දුගී බව තුරන් කිරීමේ වැඩ සටහනට සහාය ලබාදීමේ අරමුණින් ප්‍රා.ග්‍රා.සං බැංකු විසින් විශේෂ ණය ක්‍රම තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මෙම ණය ක්‍රම යටතේ ස්වයං ර. කියා සඳහා ලිහිල් කොන්දේසි මත ණය සපයන ලදී. මෙම ව්‍යාපෘතිවල සාර්ථක භාවය සහතික කරනු වස් ප්‍රතිලාභීන් පුහුණුකිරීම වැනි වෙනත් සේවාවන් සැපයීමටද ප්‍රා.ග්‍රා.සං.බැංකු කටයුතු කළහ.

ග්‍රාමීය නිෂ්පාදකයින් සිය නිෂ්පාදන අලෙවිකිරීමේදී ගැටළුවලට මුහුණ දෙන බැවින් ප්‍රා.ග්‍රා.සං.බැංකු ඔවුන් සඳහා අලෙවි ක්ෂේත්‍රයේ පහසුකම් සැපයීමටද උත්සාහ ගත්හ. මේ අනුව කුරුණෑගල, පොළොන්නරුව, මහනුවර, මොණරාගල, මාතලේ හම්බන්තොට, අනුරාධපුරය, බදුල්ල හා පුත්තලම යන ප්‍රා.ග්‍රා.සං. බැංකු රුපියල් දශලක්ෂ 20 ක් පමණ වටිනා කමින් යුත් වී, මිරිස්, එළු, සහ මුංඇට වැනි කෘෂි ද්‍රව්‍ය, කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා කිරීමේ යෝජනා ක්‍රමය යටතේ මිළදී ගන්නා ලදී. මෙම ද්‍රව්‍ය මිළ ඉහළ යන තෙක් ගබඩා කර තබාගැනීම තුලින් නිෂ්පාදකයාට ඉහළ මිලක් ලබාගැනීමට හැකිවිය.

### සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම භාර ආයතනය වන අතර, ඊට අරමුදල් සපයනු ලබන්නේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්) හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනය (සීඩා) විසිනි. ඉෆාඩ් ආයතනය විගැහි දශලක්ෂ 4.85ක ණය ආධාරද, සීඩා ආයතනය විගැහි දශලක්ෂ 4.7 ක ප්‍රදානයක් ද මෙම ව්‍යාපෘතිය සඳහා සපයනු ලැබේ. මෙය මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 74 කි. ශ්‍රී ලංකා රජයේ දායකත්වය සියයට 23 ක් වන අතර, ඉතිරි සියයට 3 සඳහා ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් දායක වේ.

1992 වර්ෂය තුලදී මෙම ව්‍යාපෘතිය මගින් මහනුවර, පුත්තලම, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක වල දරිද්‍රතා ඉමෙන් පහත මට්ටමක සිටින ග්‍රාමීය අංශයේ හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා ණය සැපයීම සිදු කරන ලදී. 1992 වර්ෂයේදී අනුමත කළ මුළු ණය ප්‍රමාණයේ මූල්‍යමය අගය 1991 හා සසඳනවිට සියයට 91 ක වැඩිවීමක් වාර්තා කෙරිණි. 1991 වර්ෂය තුළදී ප්‍රතිලාභීන් 4676 ක් වෙත රුපියල් දශ ලක්ෂ 27 ක ණය මුදලක් අනුමත කළ අතර, 1992 වර්ෂයේදී එය ප්‍රතිලාභීන් 7146 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 52 ක් විය.

1990 සිට 1992 දක්වා ප්‍රතිලාභීන් 12,518 ක් වෙත රුපියල් දශලක්ෂ 83 ක ණය මුදල් මෙම ව්‍යාපෘතිය මගින් අනුමත කොට ඇත. මෙම කාලය තුළ ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10 ක් විය. මෙම ව්‍යාපෘතියේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ සාමාන්‍ය ණය ආපසු ගෙවීමේ අනුපාතය සියයට 92 ක් වීමය. මෙම ව්‍යාපෘතියේ කාන්තා

සහභාගිත්වය මුළු ප්‍රතිලාභීන්ගේ ප්‍රමාණයෙන් සියයට 58 ක් වීම තවත් වැදගත් ලක්ෂණයක් විය.

1992 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය මගින් ගම්මාන 1006 ක සමීක්ෂණ පවත්වා තිබූ අතර, කණ්ඩායම් 2936 ක් සංවිධානය කර ව්‍යාපෘතියෙහි ලියාපදිංචි කර තිබුණි, ලියාපදිංචි කර තිබූ ප්‍රතිලාභීන්ගේ මුළු සංඛ්‍යාව 17923 කි.

ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා ඔවුන් කණ්ඩායම් වශයෙන් සංවිධානය කිරීම, ඉතුරුම් සංචලනය හා ණය සැපයීමට අමතරව පුහුණු කිරීම් හා තාක්ෂණික සහාය වැනි අනෙකුත් සේවා පහසුකම්ද මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන්ට සපයන ලදී. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතන, දිස්ත්‍රික්ක ව්‍යාපෘති කාර්යාල හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල මාර්ගයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

## ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

මහ බැංකුවේ ග්‍රාමීය බැංක සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය (ග්‍රා.බැ. සහ මා.අ.වි.) මගින් 1991 දී පවත්වන ලද පුද්ගලයන් 2385 දෙනෙකු සඳහා වූ පුහුණු පාඨමාලා 97 සමග සසඳනවිට 1992 වර්ෂයේදී පුද්ගලයන් 1901 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා 67 ක් පවත්වා තිබුණි.

1992 දී පවත්වනු ලැබූ පුහුණු පාඨමාලා 67 අතරින් පාඨමාලා 29 ක් විද්‍යාලයෙහි පැවැත්වූ අතර ඉතිරි පාඨමාලා 38, පිට පළාත්වලදී පවත්වන ලදී. පිට පළාත් වල පවත්වන ලද එකී පුහුණු පාඨමාලාවලට සහභාගි වූ 1104 දෙනාට බොහෝ සෙයින්ම ඇතුලත් වූයේ, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැ.) මගින් සලසන ලද ණය පහසුකම් ඒ වන විටත් ලබා සිටි අය හෝ ප්‍රා.ග්‍රා.සං. බැංකු වලින් දෙනු ලබන ණය පහසුකම් ලබාගැනීමට බලාපොරොත්තුවෙන් සිටි සුළු පරිමාණ ව්‍යවසායකයන් සහ ස්වයං රැකියා ලාභීන් ය. 1992 දී අභ්‍යාස විද්‍යාලයෙහි පවත්වනු ලැබූ පුහුණු පාඨමාලා 29 ට 797 දෙනෙකු සහභාගි වූ අතර, එයින් 201 දෙනෙකු ශ්‍රී ලංකා මහ බැංකුවෙන්ද 138 දෙනෙකු වානිජ බැංකුවලින්ද 458 දෙනෙකුද ප්‍රා.ග්‍රා.සං. බැංකුවලින්ද විය.

1992 වර්ෂයේදී ග්‍රාමීය බැංකු සහ මා.අ.වි. මගින් පවත්වන ලද පුහුණු පාඨමාලාවන්හි ප්‍රධාන පුහුණු ක්ෂේත්‍රයන් වූයේ, ග්‍රාමීය බැංකු කටයුතු, ව්‍යාපෘති මූලික සංවර්ධනය, වෙළෙඳ බැංකු කටයුතු, ජාත්‍යන්තර වෙළෙඳාම, විදේශ විනිමය මෙහෙයවුම් කටයුතු, කුලී පිටගැනීම් සහ බදු මූල්‍යකරණය, කළමණාකරණය, පුහුණුකරුවන් පුහුණු කරවීම, පරිගණක පුහුණුව සහ සුළු ව්‍යවසාය සංවර්ධනය යි. 1992 දී, පූර්ව සැලසුම්ගත පුහුණු වැඩ මුළු වලට අමතරව, පහත සඳහන් කාර්යයන්හි, එනම් (අ) මහබැංකුවේ ක්‍රියාකාරි නියෝජනය යටතේ ඇති සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය (ආ) කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය සහ (ඇ) මැදරට නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘති වල නියැලි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා, විශේෂ පුහුණු පාඨමාලා කීපයක් ඒ සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් අනුව ග්‍රා.බැ. හා මා.අ.වි. මගින් පවත්වන ලදී.

තවද කඩඉම් විභාග වලින් නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා අනුස්ථාපන පාඨමාලාවක් පැවැත්වූ අතර, 'මිනිස් සම්පත් සංවර්ධනය' යන මැයෙන් ග්‍රා.බැ. සහ මා.අ.වි. යේ 11 වැනි සංවත්සර දේශනය පවත්වන ලදී. එසේම, ඉංග්‍රීසි භාෂා දැනුම වැඩි දියුණු කර ගැනීමේ අවශ්‍යතාවය ඇති අයගේ ප්‍රයෝජනය සඳහා යථා කාලයේදී අභ්‍යාස විද්‍යාලය තුළ ඉංග්‍රීසි භාෂා සවයං අධ්‍යයනාගාරයක් පිහිටුවීමට අවශ්‍ය මූලික විධිවිධාන ද සලස්වා ඇත.

## සේවක අර්ථ සාධක අරමුදල

සේවක අර්ථ සාධක අරමුදල් පනතේ විධි විධානයන් අනුව එම අරමුදලට කෙරෙන දායක මුදල් සහ අධිභාර මුදල් ලබා ගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන්

ලැබෙන ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියා පදිංචි සේවායයන්ගේ හා ඒ ඒ සාමාජිකයින්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වා ගෙන යාම සහ ප්‍රතිලාභ මුදල් සාමාජිකයින් වෙත ආපසු ගෙවීම් යන වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමඟ සමීප සහයෝගීතාවයකින් යුතුව මෙම කටයුතු කර ගෙන යනු ලැබේ.

දායක මුදල්

1991 වර්ෂයේ දී ලැබූ රුපියල් දශ ලක්ෂ 4421.3 හා සසඳා බලන කල 1992 වර්ෂය තුලදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5294.5 ක් විය. මෙය කලින් වර්ෂයේ ලද දායක මුදල් වට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 873.2 කින් හෙවත් සියයට 19.7 ක වැඩිවීමකි.

සාමාජිකයින්ගේ ශේෂ

විමසුමට ලක්වන වර්ෂය සඳහා පොළී එකතු කිරීමට පෙර, 1992 දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන්හි මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 45790.6 ක්ව පැවති අතර, එය 1991 වර්ෂයේ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 7328.1 ක හෙවත් සියයට 19 ක වැඩිවීමකි.

ආයෝජන

1991 වර්ෂයේ ආයෝජනය කල රුපියල් දශ ලක්ෂ 16014.4 සමඟ සසඳා බලන කල සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුලදී, අරමුදල මගින් රජයේ සුරකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් සහ අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි ආයෝජනය කරන ලද මුදල රුපියල් දශ ලක්ෂ 26742.4 කි. මෙය 1991 දී පැවති ආයෝජන මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 10728 ක වැඩි විමකි. 1992 දෙසැම්බර් 31 වැනි දිනට අරමුදල සතු මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 54834.7 ක් වූ අතර එය 1991 මුළු ආයෝජන මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 8588.4 ක වැඩිවීමකි.

ආයෝජන වලින් ලැබූ ආදායම

1989 දේශීය ආදායම් පනතේ සංශෝධනයකට අනුව සේ.අ.අ.ට දෙන ලද ආදායම් බදු නිදහස ඉවත් .කරන ලදී. මේ අනුව 1989 අප්‍රියෙල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජන මගින් උපයන ආදායම සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත්වේ. 1992 වර්ෂය සඳහා ආයෝජන ආදායම් වෙනුවෙන් අඩු කරන ලද රඳවා ගැනීමේ බද්ද රුපියල් දශ ලක්ෂ 690.5ක් විය.

1991 වර්ෂයේ ආයෝජන මගින් ලැබූ රුපියල් දශ ලක්ෂ 5648.2 සමඟ සසඳා බලන කල 1992 වර්ෂයේදී ආයෝජන මගින් ලද ආදායම රුපියල් දශ ලක්ෂ 1257.3. ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 6905.5 ක් විය.

ප්‍රතිලාභ ආපසු ගෙවීම

1991 වර්ෂය තුළදී සාමාජිකයින්ට අ.අ. ප්‍රතිලාභ ආපසුගෙවීම් වශයෙන් ගෙවනලද මුළු මුදල රුපියල් දශ ලක්ෂ 1344.2 ක් වූ අතර, එය 1992 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 2265.1 ක් විය. මෙය රුපියල් දශ ලක්ෂ 920.9 කින් හෙවත් සියයට 68.5 ක වැඩිවීමකි. 1991 වර්ෂයේදී ගෙවා නිම කරන ලද ක් 38910 ක් වූ ප්‍රතිලාභ හා සසඳන කල 1992 වර්ෂය තුලදී ප්‍රතිලාභ ඉල්ලුම් 49864 ක් සඳහා ගෙවීම් කරණ ලදී.

සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා වූ පොලිය

සේවක අර්ථසාධක අරමුදල මගින් සෑම වර්ෂයකම අවසානයේ සාමාජිකයින්ගේ ගිණුම් වල ඇති ශේෂයන් සඳහා අරමුදලේ ආයෝජනයන් මගින් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1992 වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා ගෙවිය යුතු වූ පොළී අනුපාතය වසරකට සියයට 11.5 ක් විය.

වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති සමුච්චිත ශේෂයන් සඳහා පොළී ගෙවනු ලැබේ. සාමාජික මුදල ලැබූ දිනය නොසලකා, වර්ෂය තුළ ලද සියළුම දායක මුදල් වෙනුවෙන් මුළු වර්ෂය සඳහාම පොළී හිමිවේ. උදාහරණයක් වශයෙන් වසරේ දෙසැම්බර් මාසයේදී ලැබුණු දායක මුදල් වලටද, එම වර්ෂයේ ජනවාරි මාසයේ ලැබුණු දායක මුදල් වලට මෙන්ම මුළු වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එම නිසා මෙම අරමුදල් ශේෂ වලට ගෙවන සඵල පොළී අනුපාතිකය තරමක් දුරට ඉහළ මට්ටමක පවතී.

**සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය**

සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති ශේෂයන්ගෙන් සියයට 75 ක් දක්වා ආවරණය වන පරිදි නිවාස තැනීම් කටයුතු වෙනුවෙන් සමහර ණය දෙන ආයතන වලින් ණය ලබාගත හැකි වන පරිදි 1988 අංක 42 දරණ පනතින් සේ.අ.අරමුදල් පනත සංශෝධනය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය සඳහා සහභාගී වන ණය දෙන ආයතන වනුයේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ රට තුළ විසිරී පවතින විවිධ සේවා සමූපකාර සමිතීන්ය.

1992 දෙසැම්බර් 31 දින වන විට සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ශේෂයන් තහවුරු කිරීම සඳහා ලැබුණු මුළු අයදුම් පත් සංඛ්‍යාවෙන් අයදුම්පත් 45588 ක කටයුතු අවසාන කොට අදාල කම්කරු කාර්යාලයන් වෙත යවන ලදී.

අරමුදලෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව සංසන්දනාත්මක දත්ත 2.10 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**2.10 සංඛ්‍යා සටහන**

**සේවක අර්ථසාධක අරමුදල් සංඛ්‍යාන 1991 - 1992**

| | 1991 | 1992 |
|---|---|---|
| 1. ලැබුණු දායක මුදල් (අ) | 4,421.3 | 5294.5 |
| 2. ආයෝජන (ආ) | 16,014.4 | 26742.4 |
| 3. ආයෝජන වලින් ලද ආදායම | 5,901.7 | 6227.5 |
| 4. ප්‍රතිලාභ ආපසු ගෙවීම් | 1,344.5 | 2265.1 |
| 5. ගෙවූ ප්‍රතිලාභ සංඛ්‍යාව | 38910 | 49864 |
| 6. පොළී අනුපාතිකය (සියයට) | 11.5 | 11.5 |
| 7. සාමාජික ශේෂයන් සඳහා පොලී ප්‍රතිපාදන | 5041.2 | 5990.9 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අවිනිශ්චිත ගිණුම් වලට බැර කළ දායක මුදල් හැර

(ආ) රජයේ සුරකුම්පත් වල ප්‍රති-ආයෝජනය කල කල් පිරුණු ප්‍රේෂණ ඵලයන් හා කෙටි කාලීන හා ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළඳ පළේ සහ එක්ෂණ මුදල් වෙළඳ පළේ ආයෝජනය කළ මුදල්ද ඇතුළත්ය.

## විනිමය පාලන

1992 වර්ෂය තුළදී මහ බැංකුව විසින් විනිමය පාලන ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස් කිරීම් ඇති කරන ලදී.

1. ආනයන

ආනයනකරුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහාවූ භාණ්ඩ සහ අමතර කොටස් ආනයන සඳහා වූ සීමාව ඇ.එ.ජ.ඩොලර් 1000 සිට ඇ.එ.ජ. ඩොලර් 2000 දක්වා (මිල රක්ෂණය හා

නැව්කුලී පදනම යටතේ) හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් දක්වා වැඩි කරන ලද අතර ආනයන කරුට අවශ්‍ය ආකාරයට එම මුදල් ප්‍රේෂණය කිරීමට අවසර දෙන ලදී. 1992 දෙසැම්බර් 24 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ණයවර ලිපියක් විවෘත නොකර ගෙවීම මත ලියවිලි පදනම යටතේ කොළඹ මිල රක්‍ෂණය හා නැව්කුලී වටිනාකම ඇ.එ.ජ.ඩොලර් 5000 ක් හෝ වෙනත් විදේශීය ව්‍යවහාර මුදලකින් එයට සමාන වටිනාකමක් දක්වා, වානිජ පදනමක් මත ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීමට අවසර දෙන ලදී

ඉන්වොයිස් වටිනාකම පරිවර්ත්‍ය ව්‍යවහාර මුදල් වලින් ප්‍රකාශ කර ඇති, ඉන්දියාව සමඟ සිදු කෙරෙන භාණ්ඩ ආනයන හා අදෘෂ්‍ය ආනයන සම්බන්ධ ගණුදෙනු, ආසියානු නිෂ්කාශන සංගමයේ වැඩපිළිවෙල යටතේ පියවීමේ අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

සුඛෝපභෝගී භාණ්ඩ සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී පැවති සියයට 100 ක්වූ මුදල් ආන්තික අවශ්‍යතාවය ඉවත් කිරීමත් සමඟ කිසිම අවහිරතාවයකින් තොරව සියලුම ආනයන සහ සේවා සඳහා ගෙවීම් වෙනුවෙන් ඉදිරි විනිමය විකිණීමට, බලයලත් වෙළඳුන්ට අවසර දෙන ලදී.

1992 නොවැම්බර් 12 සිට ක්‍රියාත්මක වන පරිදි, ආනයන හා අපනයන පාලකගෙන් ලබාගත් බලපත්‍රයක් සහ තීරුබදු, පිරිවැටුම් බදු ආදිය ගෙවීමට යටත්ව, තොග බාරදීමේ පදනම යටතේ, රත්‍රන් ආනයනය කිරීමට ශ්‍රී ලංකාවේ සියලුම වානිජ බැංකුවලට අවසර දෙන ලදී. බන්ධිත ගුදම් ක්‍රමය යටතේ රත්‍රන් ආනයනය කරන ස්වර්ණාභරණ නිෂ්පාදකයන්ගෙන්, තීරුබදු රහිතව මිලට ගත් දේශීය නිෂ්පාදිත ස්වර්ණාභරණ විකිණීමට, කටුනායක පිහිටි කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි කටයුතු කරන වානිජ බැංකුවලටද අවසර දෙන ලදී. ගුවන් තොටුපලෙහි රන් අලෙවි සැල්වල විකිණීම සඳහා ස්වර්ණාභරණ සැපයීමට අදහස් කරන ස්වර්ණාභරණ නිෂ්පාදකයන්ට තීරු ගාස්තු ගෙවීමේ ප්‍රශ්නයෙන් මිදීම සඳහා බන්ධිත ගුදම් ක්‍රමය යටතේ රන් ආනයනය කළ හැකිවිය.

1992 නොවැම්බර් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මාස 6 කට වඩා වැඩි කාලයක් විදේශයක ගතකර ඇති සහ මාස 6 කට වඩා අඩු කාලයක් ගතකර ඇති සිය රට පැමිණෙන ශ්‍රී ලාංකික, විදේශ ගමන් බලපත් දරන්නන්ට, කටුනායක පිහිටි කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ආගමන පර්යන්තයේදී එක් පුද්ගලයෙකුට පිළිවෙලින් වර්ෂයකට අ.එ.ජ.ඩොලර් 5000 ක් සහ අ.එ.ජ.ඩොලර් 1000 ක් දක්වා නම් කළ ව්‍යවහාර මුදල් වලින් රත්‍රන් / ස්වර්ණාභරණ මිලදී ගැනීමට අවසර දෙන ලදී. මෙයට අමතරව තීරුබදු ගෙවා වර්ෂයකට එක් පුද්ගලයෙකුට ඇ.එ.ජ.ඩොලර් 500 ක රන් / ස්වර්ණාභරණ මිලදී ගත හැකිවිය.

**2. අපනයන**

1992 ජනවාරි 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තරාළ වෙළඳ ගණුදෙනු යටතේ ණයවර ලිපි මත හෝ ගෙවීම මත ලියවිලි පදනම යටතේ භාණ්ඩ ප්‍රති අපනයනය කිරීමට අවසර දෙන ලදී.

1992 මාර්තු 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ත්‍යාග සහ වෙළෙඳ සාම්පල අපනයන සඳහා පැනවූ සීමාව රු. 3,500 සිට රු. 10,000 දක්වා වැඩි කෙරුණි. 1992 මාර්තු 20 සිට ක්‍රියාත්මක වන පරිදි, ඉන්දියානු කලාපයේ රටවලට හා අනෙකුත් රටවලට චාරිකා කරන මගී කාන්තාවන් විසින් ආපසු ගෙන ඒමේ පදනම මත ගෙනයනු ලබන, පුද්ගලික ස්වර්ණාභරණ අපනයන සඳහාවූ සීමාව, පිළිවෙලින් රු. 90,000 සිට රු. 1,00,000 දක්වා සහ රු. 90,000 සිට රු. 1,50,000 දක්වා වැඩි කෙරුණි.

**3. චාරිකා**

(අ) 1992 අගෝස්තු 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඉන්දියානු කලාපයේ රටවලට සංචාරය කරන නේවාසික ශ්‍රී ලාංකිකයන් සඳහා ප්‍රදානය කෙරෙන නිවාඩු විනිමය සලාකය, වැඩිහිටියකු සඳහා අ.එ.ජ. ඩොලර් 800 ක් සහ අවුරුදු 12 ට අඩු ළමයෙකු සඳහා අ.එ.ජ.ඩොලර් 400 ක් දක්වා වැඩි කෙරුණි. අනෙකුත් රටවල් සඳහා, මෙය පිළිවෙලින් වැඩිහිටියකු සඳහා අ.එ.ජ.ඩොලර් 7,500 ක් සහ අවුරුදු

12 ක අඩු ළමයකු සඳහා අ.එ.ජ.ඩොලර් 3,750 ක් විය. ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කෙරුණු සැලකියයුතු කාලපරිච්ඡේදයක් ශ්‍රී ලංකාවෙන් පිටත සිටි (මාස 6 කට වැඩි) සහ කෙටි කාලයක් නැවතී සිටීම සඳහා ශ්‍රී ලංකාවට ආපසු පැමිණි ශ්‍රී ලාංකිකයන් විසින් මූලික විනිමය සඳහා අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුවිය.

(ආ) 1992 අගෝස්තු 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්දියානු කලාපයේ රටවලට හා අනෙකුත් රටවලට ව්‍යාපාර කටයුතු සඳහා සංචාරය කරන පුද්ගලයන් සඳහා වූ දෛනික දීමනාවන් සියයට 50 කින් වැඩි කෙරුණි. 1992 දෙසැම්බර් අග වනවිට පොදු සමාගම්වල සභාපති / අධ්‍යක්ෂවරුන්ට අදාල වන අනුපාතිකයන් පිළිවෙලින් අදාල, කලාපයන්හි රටවල් සඳහා අ.එ.ජ. ඩොලර් 350 ක් සහ අ.එ.ජ.ඩොලර් 450 ක් විය. අනෙකුත් සමාගම්වල සේවකයන් සඳහා වූ ව්‍යාපාරික සංචාරක දීමනාවන්ද වැඩි කෙරුණි.

4. අධ්‍යාපන

ප්‍රාථමික, ද්විතියික, පූර්ව උපාධි, වෘත්තීය හා කාර්මික අධ්‍යාපනයන් සඳහා එක්සත් රාජධානිය වෙත යන සිසුන් වෙනුවෙන් ලබාදෙන ජීවන වියදම් දීමනාව 1992 අගෝස්තු 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂයකට එ.රා.පවුම් 4,800 සිට එ.රා.පවුම් 9,000 දක්වා ද, පශ්චාත් උපාධි අධ්‍යයනයන් සඳහා වර්ෂයකට එ.රා.පවුම් 5,400 සිට එ.රා.පවුම් 10,000 දක්වාද වැඩි කෙරුණි. අනෙකුත් රටවලට යන සිසුන් සඳහා ද ජීවන වියදම් දීමනාවේ වැඩිකිරීම් පිළිබඳව එකී මෙහෙයුම් උපදෙස්වලින්ම ප්‍රතිපාදනයන් සලස්වන ලදී.

5. විගමන

1992 මාර්තු 16 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පිටරට පදිංචිය සඳහා යන පුද්ගලයින් සඳහා රටින් බැහැරව යන අවස්ථාවේදී එක් පවුලකට රුපියල් දශ ලක්ෂයක සීමාවකට යටත්ව එක් පුද්ගලයෙකුට රුපියල් 5,00,000 ක ප්‍රාග්ධන සංක්‍රාම, අනුමත කරන ලදී. පෞද්ගලික බඩු බාහිරාදිය අපනයනය පිළිබඳ සීමාව වැඩිහිටියන් සහ වයස අවුරුදු 12 කට අඩු ළමයින් සඳහා පිළිවෙලින් රු. 30,000 ක් සහ රු. 15,000 ක් දක්වා වැඩි කරන ලදී.

6. අවහිර කරන ලද අරමුදල්

ශ්‍රී ලංකාවෙන්, පිටරට පදිංචිය සඳහා ගිය පහත දැක්වෙන කාණ්ඩවලට අයත් ශ්‍රී ලාංකිකයන්ගේ බැරට, 1992 ජූනි 30 වෙනි දිනට පැවැති, අනුමත කරන ලද සියළුම අනේවාසික අවහිර කරන ලද අරමුදල්, නිදහස් කිරීමට හැකිබව 1992 ජූලි 23 දිනැති මෙහෙයුම් උපදෙස් වලින්,අවසර ලත් වෙළඳුන් වෙත දන්වන ලදී.

1. පිටරට පදිංචිය සඳහා ගිය සහ විදේශීය පුරවැසිභාවය ලබාගත් ශ්‍රී ලාංකිකයන් සහ

2. විදේශයන්හි ස්ථිර නේවාසික තත්ත්වයන් ලබා සිටින සහ 1992 ජූනි 30 වෙනි දිනට වසර 5 ක් හෝ ඊට වැඩි කාලයක් අනේවාසික ගිණුම් අවහිර කර ඇති ශ්‍රී ලාංකිකයන්

7. සුරැකුම්වල ආයෝජනය කිරීම

අනුමත කළ දේශිය අරමුදල්වලට, අනුමත කළ කලාපීය අරමුදල්වලට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වලට සහ ශ්‍රී ලාංකිකයන් ඇතුළු අනේවාසික පුද්ගලයින්ට නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට 100 ක් දක්වාවූ සමාගම් කොටස්, නිකුත් කිරීමට හා සංක්‍රාම කිරීමට, 1992 ජූනි 29 දින අංක 721/41 දරන රජයේ ගැසට් පත්‍රයෙහි දක්වා ඇති සමහර ඉවත් කිරීම්, සීමාවන් හා කොන්දේසිවලට යටත්ව අනුමැතිය දෙන ලදී.

මෙම ආයෝජන කටයුතු පහසු කිරීම සඳහා ආයොජකයන්ගේ නමින් 'කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම්' විවෘත කිරීමට හා පවත්වාගෙන යෑමට බලය ලත් වෙළඳුන්ට අවසර ලැබුණි. තවද අනේවාසික විදේශිය ව්‍යවහාරමුදල් ගිණුම් (අ.වි.ව්‍ය.මු.ගි.)

හිමියන්ට සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක ගිණුම් හිමියන්ට සිය ගිණුම්වල ඇති විදේශීය ව්‍යවහාර මුදල් වලින් මෙම සමාගම්වල ආයෝජනය කිරීමටද අවසර ලැබුණි.

8. ණය සහ අයිරාවන්

කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම් මගින් ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට 100 ක් දක්වා මෙම කාණ්ඩයේ සමාගම්වල කොටස් මිල ගැනීමට, විදේශීය ආයෝජකයන්ට විනිමය පාලන අවසර ලබාදීමේ ප්‍රතිඵලයක් වශයෙන්, කොළඹ කොටස් හුවමාරුවෙහි නම් කර ඇති පොදු සමාගම්වල විදේශීය කොටස් අනුපාතය නිතර වෙනස්වීම නිසා, විනිමය පාලන පනතේ 30(7) ජේදයේ අරමුණු සඳහා කොටස්වල හිමිකම නොසලකා අනේවාසික අධ්‍යක්ෂවරුන් වැඩි කොටසකට අයත් වන පොදු සමාගම් පමණක් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍යවන සේ සැලකීමට සංශෝධනයක් හඳුන්වා දෙන ලදී.

9. රේගුව වෙත විදේශ ව්‍යවහාර මුදල් පිළිබඳ ප්‍රකාශ කිරීම

1992 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි නේවාසික හා නේවාසික නොවන ශ්‍රී ලාංකිකයන්ට, ඔවුන් විදේශ රටවලට යන ගමන් වාර ගණන නොසලකා රේගුව වෙත ප්‍රකාශයක් නොකර ඇමෙරිකානු ඩොලර් 5,000 දක්වා හෝ වෙනත් පරිවර්ත්‍ය ව්‍යවහාර මුදලකින් ඊට සමාන විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් පුද්ගලිකව ආනයනය සහ අපනයනය කිරීමට අවසර දෙන ලදී.

## රාජ්‍ය ණය

මුදල් නීති පණතේ 113 වැනි වගන්තිය ප්‍රකාර රජය වෙනුවෙන් රාජ්‍ය ණය කළමනාකරණය මහ බැංකුව විසින් කරගෙන යනු ලැබීය. මහබැංකුව විසින් යොදාගන්නා ලද ප්‍රධාන ණය උපකරණ ලෙස රජයේ සුරැකුම්පත් / ණය, භාණ්ඩාගාර බිල්පත්, ණයකර හා භාණ්ඩාගාර තැන්පතු සහතික දැක්විය හැකිය. රජයේ විදේශ ණය කළමනාකරණය හා සේවාකරණය ද බැංකුව විසින් මෙහෙයවන ලදී. මීට අමතරව, විදේශීය ණය හා දේශීය ණය පිළිබඳව දත්ත පදනමක් පවත්වාගෙන යාම සහ රාජ්‍ය ණය පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනයේදී ආධාරකයක් වශයෙන් අධ්‍යයනයන් ද සිදුකරන ලදී.

1992 වර්ෂය අවසාන වනවිට නොපියවා තිබූ දළ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 418,624 ක් විය. එහි වැඩිවීම රුපියල් දශලක්ෂ 38,848 ක් වුවත් එය 1991 වැඩිවීමට වඩා අඩු ප්‍රමාණයකි. 1992 අවසාන වනවිට නොපියවා තිබූ විදේශ ණය වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 238,730 කි. එම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 19,747 ක වැඩිවීමක් පෙන්වූ අතර ඉන් රුපියල් දශලක්ෂ 12,531 ක් විදේශ විනිමය අනුපාතයේ අගය පිරිහීම හේතුකොටගෙන ඇතිවූවකි. නොපියවා තිබූ මුළු රාජ්‍ය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් විදේශ ණය ප්‍රමාණය සියයට 57 ක් වූ අතර ඉතිරි සියයට 43 ක ප්‍රමාණය දේශීය ණය වලින් සමන්විත විය.

1992 තුළදී රුපියල් දශලක්ෂ 20,920 ක් වටිනා රුපියල් ණය ලබාගන්නා ලදී. වර්ෂය තුළදී රුපියල් ණය මුළු ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 18,094 ක් හා රුපියල් දශලක්ෂ 9,273 ක් විය. 1992 වර්ෂය අවසාන වනවිට නොපියවා තිබූ මුළු රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 73,712 ක් වූ අතර එයට රුපියල් දශලක්ෂ 4,532 ක ජාතික ආරක්ෂක බැඳුම්කර ද ඇතුළත් විය. සේවක අර්ථසාධක අරමුදල 1992 වර්ෂයේ දී ද රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයා වූ අතර වර්ෂය අවසානවන විට එහි දායකත්වය නොපියවූ මුළු රුපියල් ණය ප්‍රමාණයෙන් සියයට 74 ක් විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව මුළු නොපියවූ ණය ප්‍රමාණයෙන් සියයට 19 ක ප්‍රමාණයක් දරන ලදී.

1992 දෙසැම්බර් මස 16 වන දින, භාණ්ඩාගාර බිල්පත් සඳහා අනුදත් සීමාව රුපියල් දශලක්ෂ 90,000 සිට රුපියල් දශලක්ෂ 125,000 දක්වා වැඩි කරන ලදී. භාණ්ඩාගාර බිල්පත්

අලෙවිය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් දෙකක් 1992 වර්ෂය තුළදී සිදුවිය. මේදක්වා අනුගමනය කළ පිළිවෙතින් බැහැර වෙමින් 1992 ජූලි මස 24 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාර බිල්පත් අලෙවිය සඳහා බලයලත් ප්‍රාථමික වෙළඳ නියෝජිතයින් පත් කරන ලදී. එතැන් පටන් සතිපතා ටෙන්ඩර් නිකුතුවේදී භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමට ඉඩ දෙනු ලබන්නේ බලයලත් ප්‍රාථමික වෙළඳ නියෝජිතයින්ට පමණක් වන අතර මහජනතාව මෙම නියෝජිතයින්ගෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත යුතුවිය. කෙසේ වෙතත් ග්‍රාහක මූලයන්ගෙන් ලැබෙන තරඟකාරී නොවන ලංසු ද, අදාල පරිණත කාලසීමාවන් සඳහා බර තබන ලද එළදා අනුපාතයන් මත භාර ගන්නා ලදී. 1992 වර්ෂය අවසාන වනවිට ප්‍රාථමික වෙළඳ නියෝජිතයින් 18 ක් එනම් වාණිජ බැංකු 13 ක්, මුදල් බ්‍රෝකර් ආයතන 4ක් හා ඒකක භාර අරමුදල් කළමනාකරණ සමාගම් එකක්, බලයලත් ප්‍රාථමික වෙළඳ නියෝජිතයන් වශයෙන් පත්කර තිබුණි. පරිණත කාලය මාස 03, 06 හා 12 ට අමතරව මාස 24, 36 හා 48 ක් වන දිගුකාලීන පරිණත කාලයක් සඳහා ද ලංසු භාරගැනීම ආරම්භ කිරීම අනෙක් ප්‍රතිපත්තිමය වෙනස්කමයි. මාස 03 ට අඩු පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බිල්පත් ද මහ බැංකුව වෙත නිකුත් කරන ලදී. 1992 වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් දැකිය හැකි, කැපී පෙනෙන ලක්ෂණය වූයේ මහ බැංකුව විසින් දරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් හිමිකම් ප්‍රමාණය 1991 අවසානයේදී සියයට 48 සිට 1992 අවසානයේදී සියයට 29.9 දක්වා පහත වැටීමයි. 1991 වර්ෂය අවසානයේදී නොපියවා තිබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයවූ රුපියල් දශ ලක්ෂ 72968 හා සසඳන විට 1992 වර්ෂය අවසානයේදී එය රුපියල් දශ ලක්ෂ 87,096 ක් විය. මෙම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 14,128 ක නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් නිසා ඇතිවූවකි. භාණ්ඩාගාර බිල්පත් සඳහා වර්ෂය තුළ ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11,355 ක් විය.

1990 දී ආරම්භ කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතික නිකුත් කිරීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මෙම සහතික මාස 6, 12, 24 යන පරිණත කාලයන් සඳහා නිකුත් කළ අතර ඒ සඳහා අදාල පොලී අනුපාතයන් පිළිවෙලින් සියයට 17.15, සියයට 18.06 හා සියයට 19.83 ක් විය. 1992 අවසාන වනවිට නොපියවා තිබූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 102 ක් විය.

1992 වර්ෂය තුළ මැදි හා දිගුකාලීන විදේශීය රාජ්‍ය ණය මුළු ප්‍රතිලබ්ධීන් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 14,355 ක් විය. උපයෝගී කරගන්නා ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 68.3 ක් ව්‍යාපෘති ණය වූ අතර ඉතිරි ප්‍රමාණය ව්‍යාපෘති නොවන ණය වලින් සමන්විත විය. 1992 දී විදේශීය රාජ්‍ය ණය සඳහා මුළු පොලී ගෙවීම් හා අනෙකුත් ගාස්තු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,725 ක් විය.

## ප්‍රාදේශීය කාර්යාල - මාතර, අනුරාධපුර සහ මාතලේ

මාතර, අනුරාධපුරය සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාලයන්හි සංවර්ධන ආශ්‍රිත ක්‍රියාකාරකම් එනම් ඉදිරිකාලයේ ණය ලාභීන් විය හැකි පුද්ගලයින් සඳහා ප්‍රතිලාභී පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම, සංවර්ධන කටයුතු සඳහා යොදාගනු ලැබිය හැකි සම්පත් හඳුනාගැනීම සහ ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතුවල නියැලී සිටින රජයේ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම වැනි කාර්යයන්හි වැඩිවීමක් සිදුවිය. එසේ වුවද, 1991 දෙසැම්බර් මාසයේදී මැදි හා දිගු කාලීන ණය අරමුදල් යෝජනාක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය ලබාදීම අත්හිටුවීම හේතුවෙන්, 1992 වසර තුල ව්‍යාපෘති හඳුනාගැනීම, ඇගැයීම් සහ එළදායි ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා එම ව්‍යාපෘතීන් ණය දෙන ආයතන වෙත නිර්දේශකිරීම සහ එවැනි ව්‍යාපෘති පිළිබඳ පසුවිපරම් කිරීම වැනි මූලික කටයුතුවල අඩුවීමක් සිදුවිය.

විමසුමට ලක්වන වසර තුලදී, ව්‍යාවහාර මුදල් කටයුතු, චෙක්පත් නිශ්කාශනය, හා දත්ත රැස්කිරීම යනාදී ප්‍රාදේශීය කාර්යාල මගින් ඉටුකරනු ලබන සම්ප්‍රදායික මහ බැංකු කටයුතුවල පුළුල්වීමක් සිදුවිය. තවද කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය හා නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ණය ලබාගැනීම සඳහා යෝග්‍ය ණය ලාභීන්ට අවශ්‍යවන ගොවිපළ අයවැය හා මුදල් ප්‍රවාහ ලේඛන පිළියෙල කිරීමට සහාය වීම ප්‍රාදේශීය කාර්යාල

විසින් කරගෙන යන ලදී. ග්‍රාමීය ප්‍රදේශවල බැංකු පුරුදු වැඩිදියුණුකිරීමේ අභිලාශයෙන් ප්‍රාදේශීය කාර්යාල විසින් ඒ ඒ ප්‍රදේශවල ගම් මට්ටමේ රැස්වීම් (ජනහමු) පැවැත්වීමට කටයුතු යොදන ලදී.

1992 වසර තුල අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන කාර්යය වූයේ ඉදිරිකාලයේ ණය ලාභීන් විය හැකි පුද්ගලයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමයි. අදාල වසර තුලදී අනෙකුත් සංවර්ධන ආයතනවල සහයෝගය ඇතිව ප්‍රාදේශීය කාර්යාලය විසින් කෘෂිකර්මය, පශු සම්පත් සංවර්ධනය සහ සහල් සැකසීම වැනි විෂයන් ඇතුලත් වන පරිදි පුහුණු පංති 49 ක් පවත්වා ඇත. මෙම පුහුණු පංතිවලට 3000 ක් පමණ සහභාගි විය. ප්‍රාදේශීය කාර්යාලය විසින් කුරුණෑගල හා පොළොන්නරුව ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ශාඛාවන් කිහිපයක් පරීක්ෂා කරන ලදී. මෙම කාර්යාලය මගින් හොරොව්පතාන උප දිසාපති කොට්ඨාශයේ තෝරාගත් ගමක සම්පත් සමීක්ෂණයක් ද කරන ලදී.

අදාල වසර තුල මාතර ප්‍රාදේශිය කාර්යාලය එම ප්‍රදේශයේ තෝරාගන්නා ලද ගම් කිහිපයක සම්පත් සමීක්ෂණයන් කරන ලදී. ණය ලබාදීම සඳහා ප්‍රාදේශීය කාර්යාලය මගින් ණය දෙන ආයතනවලට නිර්දේශ කළ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව තියුණු ලෙස අඩුවිය.

මාතලේ ප්‍රාදේශීය කාර්යාලය, 1992 වසර තුලදී රුපියල් දශලක්ෂ 32.8 ක් වටිනා ව්‍යාපෘති 2434 ක් නිර්දේශ කරන ලදී. පසුගිය වසර හා සසඳන විට නිර්දේශ කළ ව්‍යාපෘති සංඛ්‍යාව සියයට 46 ක අඩුවීමක් පෙන්නුම්කරයි. ප්‍රාදේශීය කාර්යාලය විසින් 1500 ක් පමණ වූ රැකියා විරහිත තරුණ තරුණියන් සහ කුඩා පරිමාණයේ ව්‍යවසායකයන් සඳහා ප්‍රතිලාභී පුහුණු වැඩ සටහන් 09 ක් පවත්වන ලදී. නිෂ්පාදකයන් සඳහා අලෙවිකරණ පහසුකම් සපයාදීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය කාර්යාලය විසින් ගොවීන්ට (විශේෂයෙන් කුඩා පරිමාණයේ ලොකු ළූණු නිෂ්පාදකයින්ට) ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා සහාය ලබාදෙන ලදී. මීට අමතරව ප්‍රාදේශීය කාර්යාලය විසින් මධ්‍යම පළාතේ සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රා.ග්‍රා.සං.බැංකු ශාඛා පරීක්ෂා කරන ලදී.

මාතර හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයන්හි ව්‍යවහාර මුදල් ඒකක මගින් ඒ ඒ ප්‍රදේශවල වාණිජ බැංකු, හා අනෙකුත් ආයතන හා සාමාන්‍ය මහජනතාවගේ ව්‍යවහාර මුදල් හුවමාරු පහසුකම් සැපයීමට කටයුතු කරන ලදී. යථෝක්ත ප්‍රාදේශිය කාර්යාල දෙකෙහි මුදල් සුරක්ෂිතාගාරවල මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ පහසුකම් ඒ ඒ ප්‍රදේශවල වාණිජ බැංකුවලට ලබාදීමට කටයුතු කරන ලදී. 1992 වසර තුල මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් සංසරණයේ පවතින මුදල් නෝට්ටුවල පවිත්‍රතාව රැකගැනීමේ අවශ්‍යතාව පිලිබඳ මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් 'පවිත්‍ර මුදල් නෝට්ටු සතියක්' මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කවල පවත්වන ලදී.

භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපලේ අලෙවිය සඳහා බලයලත් වෙළඳුන් පත්කිරීමත් සමඟ ප්‍රාදේශීය කාර්යාල විසින් භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1992 ජුනි මාසයේ දී අත්හිටුවන ලදී. මාතර, අනුරාධපුරය හා මාතලේ ප්‍රාදේශිය කාර්යාල විසින් 1992 ප්‍රථම භාගය තුල අලෙවිකරන ලද භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම පිළිවෙලින් රුපියල් දශලක්ෂ 66.2 ක් රුපියල් දශලක්ෂ 0.1 ක් සහ රුපියල් දශලක්ෂ 66.9 ක් විය.

ප්‍රාදේශිය කාර්යාල විසින් වාණිජ බැංකු සඳහා සපයන ලද ප්‍රාදේශිය චෙක්පත් නිෂ්කාශන පහසුකම් 1992 වර්ෂය තුලදීද ලබාදෙන ලදී. 1992 වසර තුලදී මාතර පිහිටි ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශනාගාරය මගින් රුපියල් දශලක්ෂ 2305 ක් වටිනා චෙක්පත් 174198 ක් නිෂ්කාශනය කළ අතර, අනුරාධපුර නිශ්කාශනාගාරය රුපියල් දශලක්ෂ 1780 ක් වටිනා චෙක්පත් 115389 ක් නිෂ්කාශනය කරන ලදී. මාතලේ ප්‍රාදේශිය කාර්යාලය සතුව පවතින මහනුවර හා මාතලේ නිෂ්කාශනාගාර මගින් රුපියල් දශලක්ෂ 11216 ක් වටිනා චෙක්පත් 406830 ක් නිෂ්කාශනය කරන ලදී.

මහබැංකුව මගින් පවත්වන ලද දීප ව්‍යාප්ත දත්ත එක්රැස්කිරීමේ වැඩ සටහනට සහ අනෙකුත් ප්‍රාදේශීය සමීක්ෂණ වලට ප්‍රාදේශීය කාර්යාල යන්ද ස්වකීය ප්‍රදේශවලදී සහභාගිවිය.

ප්‍රාදේශීය කාර්යාල මගින් 1992 වර්ෂය තුළදී පාසැල් ළමුන් සඳහා මහ බැංකුව විසින් පවත්වන ලද ආර්ථික විද්‍යාව සහ බැංකු කටයුතු පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් සඳහාද සහාය විය.

## ප්‍රවෘත්ති සහ ප්‍රකාශන

ප්‍රවෘත්ති ඒකරාශිකරන්නා / බෙදාහරින්නා වශයෙන් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය ඉටුකර ගැනීමෙහි ලා මෙම දෙපාර්තමේන්තුව තවදුරටත් තත් ක්ෂේත්‍රයෙහි පෙරමුණෙහි සිටී. මෙම ප්‍රයත්නයෙහි ලා දෙපාර්තමේන්තුව සමාජ - ආර්ථික ප්‍රවර්ධනයන්හි මෑත උපනතීන් පිළිබඳව සමීප අවධානයකින් පසු වූ අතර, ශිෂ්‍යයිනට, ගුරුවරුනට, පර්යේෂකයිනට මෙන් ම පොදු මහජනතාවට ද ප්‍රයෝජනවත් වියහැකි ප්‍රකාශිත හා මෙතෙක් ප්‍රකාශයට පත් නොවූ ලිපි ලේඛනාදිය සැපයීමේ නිතර විය. ප්‍රවෘත්ති බෙදාහැරීමෙහි ලා ප්‍රධාන මූලයන් වූයේ පහත සඳහන් මහබැංකු ප්‍රකාශනයන් ය.

| | | |
|---|---|---|
| 1. | වාර්ෂික වාර්තාව 1991 | (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) |
| 2. | ආර්ථික සමීක්ෂණය 1992 ප්‍රථම භාගය | (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) |
| 3. | මාසික විවරණිකාව | (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) |
| 4. | ද්විමාසික විවරණිකාව | (ඉංග්‍රීසි) |
| 5. | සමාජ ආර්ථික දත්ත 1992 | (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) |
| 6. | කාලීන පත්‍රිකා අංක 21. | |
| 7. | මහ බැංකු සැකැස්ම සහ කාර්යභාරය (සිංහල) | |
| 8. | විනිමය ලිහිල් කිරීම - ආනයන සහ අපනයනකරුවනට උපදෙස් | |
| 9. | උපාධි නිබන්ධනය - 1977-87 ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිශෝධන | |
| 10. | 'සටහන' විශේෂ කලාපය | |
| 11. | ශ්‍රී ලංකාව - ආර්ථික මූල්‍ය හා කර්මාන්ත අත්පොතක් | |

දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයන් වන 'සටහන', 'නිව්ස් සර්වේ' හා 'බැංකු පුවත්' වැනි සඟරා නොකඩවා පළ කරන ලදී.

වසර තුළ පුස්තකාලයට පොත්පත් හා පත්‍රිකා 591 එක් කළ අතර, වාර ප්‍රකාශන 223 කට දායක විය. බැංකු සහ වෙනත් ආයතන වලින් තිළිණ හා හුවමාරු වශයෙන් පොත්පත් සහ පත්‍රිකා 250 ක් ලැබිණි. එක්රැස් කරගන්නා ලද මෙම ප්‍රකාශන හේතුකොටගෙන දත්ත හා ප්‍රවෘත්ති සැපයීමේ ප්‍රධානතම මූලය වන පුස්තකාලයට ආර්ථික, බැංකු කටයුතු, ගණකාධිකරණය හා වෙනත් අදාළ විෂයයන් සම්බන්ධ ප්‍රකාශන සංඛ්‍යාව වැඩිකර ගැනීමට හැකිවිය.

දෙපාර්තමේන්තුව තවදුරටත් ජනමාධ්‍යයන් සමඟ සුහද සබඳතාවය පවත්වාගෙන ආයේය. වර්ෂය තුළ මාධ්‍ය සාකච්ඡා ගණනාවක් පවත්වන ලද අතර, වැදගත් ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳ පුවත් නිවේදන ද නිකුත් කරන ලදී.

තවද දෙපාර්තමේන්තුවේ වීඩියෝ ඒකකය බැංකුවට අදාළ වැදගත් අවස්ථාවන් ප්‍රමාණවත් පරිදි වාර්තාකර ගනිමින් රූපවාහිනිය ඔස්සේ ප්‍රචාරය කරවීමට කටයුතු කළේය. මෙම

ඒකකය ඊට අයත් කටයුතු ව්‍යාප්ත කරමින් වැදගත් තේමා හා විෂයයන් අළලා කෙටි වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කළ අතර, වර්ෂය තුළදී සම්පූර්ණ කළ ඉන් පළමුවැන්න වූයේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහාවූ ජාත්‍යන්තර අරමුදල් ආයතනයේ අනුග්‍රහය ඇතිව නිෂ්පාදනය කළ ග්‍රාමීය සංවර්ධන කටයුතු පිළිබඳ වැඩසටහනකි.

මාධ්‍ය ඒකකයේ කලා සහ දෘෂ්‍ය අංශය විවිධ දෙපාර්තමේන්තුවල අත්පොත් සහ ප්‍රකාශන සැලසුම් කිරීමේ කටයුතුවල තවදුරටත් නියැළිණි. 1993 වර්ෂයේ පැවැත්වීමට අපේක්ෂිත අනුබුදු මිහිඳු ජයන්තිය සැමරීම සඳහා නිකුත් කිරීමට නියමිත කාසිය සඳහා රූ රටා නිර්මාණය පිළිගැනීම මෙම අංශයේ නිපුණතාවයට දෙස් දෙන්නකි.

දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද අධ්‍යාපනික වැඩසටහන් අ.පො.ස. උසස් පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා එම ක්ෂේත්‍රයේ ගුරුභවතුන් අරමුණු කරන්නක් විය. බැංකු කාර්‍ය මණ්ඩලයේ' විශේෂයෙන් තෝරා ගන්නා ලද නිලධාරීන් විසින් පවත්වන ලද වැඩසටහන් මගින්, මොනරාගල, අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්කයන්හි 5000 ක් පමණ වන සිසුහු ප්‍රයෝජන ලැබූහ.

බැංකු මුද්‍රණාලය දැනට බැංකු ප්‍රකාශන වලින් සියයට 90 ක් පමණ මුද්‍රණ කටයුතු භාරගෙන ඇත. මුද්‍රණාලය විසින් භාරගනු ලැබූ වැඩපැවරුම් සැලකිල්ලට ගත් කළ සමාලෝචිත වර්ෂය තුළ මුද්‍රණ වියදම් වශයෙන් රුපියල් දශලක්ෂ 2 ක පමණ මුදලක් බැංකුවට ඉතිරිකර දී ඇත. මුද්‍රණාලය තවදුරටත් යන්ත්‍රෝපකරණ එකතු කරගනිමින් සිය ධාරිතාවය වැඩිකර ඇත.

## පර්යේෂණ කටයුතු

වර්ෂය තුළදී බැංකුවේ නිලධාරීහු පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක් සම්පූර්ණ කළහ. දැනට බැංකුවේ ක්‍රියාත්මක වෙමින් පවතින පර්යේෂණ පුහුණු වැඩසටහන් යටතේ සමහර නිලධාරීන් වෙත පවරන ලද සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් තමන්ගේම මූලිකත්වයෙන් ආරම්භ කරණ ලද හෝ වෙනත් ආයතනවල ඉල්ලීම් සපුරාලීම පිණිස කරන ලද සමහර පර්යේෂණ අධ්‍යයනයන්, මේවාට ඇතුලත්විය. මේවායින් සමහරක්, 1993 වර්ෂයතුළ පළකිරීමට නියමිතව ඇත.

## සමීක්ෂණ සහ දත්ත රැස්කිරීම

**දිළිඳු ජන කොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කෙරෙන ණය අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය - 1992**

දිළිඳු ජන කොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව රටෙහි ණය අවශ්‍යතා ගැන සොයා බැලීම සඳහා පුළුල් කුටුම්භ සමීක්ෂණයක් 1992 වසරේදී මහ බැංකුව විසින් ආරම්භ ලදී. මෙම සමීක්ෂණයේ අරමුණු වනුයේ,

(අ) ආයතනික ණය, ග්‍රාමීය අංශය තුළ ව්‍යාප්ත වී ඇති ආකාරය හඳුනා ගැනීම හා නාගරික, ග්‍රාමීය හා වතු අංශයෙහි ජීවත් වන අඩු ආදායම් ලාභීන්ගේ ණය අවශ්‍යතා ආයතනික ණය මගින් කොතෙක්දුරට ඉටුවී ඇත්ද යන්න සොයා බැලීම.

(ආ) දැනට ණය ලබාගෙන ඇති සහ ණය ලබාගෙන නොමැති අයගේ ණය අවශ්‍යතා පිළිබඳව ඇගයීම.

(ඇ) ණය ලබාගන්නන් හට දැනට ලැබෙන බැංකු ණය වල ප්‍රමාණවත් බව හා ඔවුන් සඳහා ඇති අනිකුත් ණය මූලාශ්‍රයන් පිළිබඳව තක්සේරුකිරීම.

(ඈ) ආයතනික මූලාශ්‍රයන්ගෙන් ලබාගත් මුදල් යොදවා ආරම්භ කොට ඇති ව්‍යාපෘතීන් හි සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය ඇගයීම

(ඉ) අවිධිමත් අංශයෙන් ණය ලබා ගැනීමේ හේතු විමර්ශනය කිරීම.

මෙම අරමුණු ඇතිව, ආදායම් උත්පාදන කටයුතු, ණය මූලාශ්‍රයන්, ණය උපයෝජනය, ව්‍යවසායකත්වය සහ ණය ආපසු ගෙවීම් හා සම්බන්ධ තොරතුරු නියැදියේ වූ කුටුම්භයන්ගෙන් එක්රැස් කරනු ලැබේ. ණය අවශ්‍යතා සම්බන්ධයෙන් ගැඹුරු විශ්ලේෂණයක් කිරීම සඳහා අවශ්‍ය ජනවිකාශ ලක්ෂණ, නිවාස තත්ත්වයන්, ඉඩම් උපයෝජනය, ශ්‍රම හමුදාව, සේවා නියුක්තිය හා මිනිස්බල යෙදවීම්, කුටුම්භ ආදායම, ඉතිරිකිරීම් හා ණයගැතිභාවය ආදී සමාජ-ආර්ථික තත්ත්වයන්ට අදාල තොරතුරු ද කුටුම්භයන් ගෙන් රැස්කර ගැනේ.

මෙම සමීක්ෂණයේදී, ග්‍රාමීය අංශය නියෝජනය කෙරෙන ගම් 216 කින් ද නාගරික අංශය නියෝජනය කෙරෙන නාගරික කොට්ඨාශ 43 කින් ද, වතු අංශය නියෝජනය කෙරෙන වතු 10 කින් ද සමන්විත කුටුම්භ 32000 කින් පමණ යුත් නියැදියකින් තොරතුරු එක් රැස්කරගනු ලැබේ. 1992 මැයි මාසයේදී ආරම්භ කරන ලද දත්ත රැස්කිරීම, කාලීන වෙනස්කම් ද හසුකර ගතහැකි වන පරිදි වසරක කාලයක් පුරා කර ගෙන යනු ලැබේ. දත්ත රැස්කිරීම, ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු හා දත්ත සැකසීම මුළුමනින්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කාර්ය මණ්ඩලය මඟින් සිදු කරනු ලැබේ.

## දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල

1978 දී ආරම්භ කළ දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩ සටහන 1992 වසර තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිළ, ප්‍රධාන කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන මිළ, අසංවිධිත තේ, රබර් හා පොල් වගාව යන අංශවල හා ඉදිකිරීම් අංශයන්හි වැටුප් අනුපාතික හා ප්‍රධාන කෘෂිකාර්මික යෙදවුම් මිළ පිළිබඳ දත්ත දිවයින පුරා පිහිටි තෝරාගත් මධ්‍යස්ථාන 100 කින් පමණ ක්‍රමික පදනමක් යටතේ රැස්කරනු ලැබිණි. මෙම වැඩපිළිවෙල යටතේ තොරතුරු රැස්කරනු ලබන්නේ තෝරාගන්නා ලද රජයේ ගුරු භවතුන් පිරිසක් මඟිනි.

## ජාතික ගිණුම්

ජාතික ගිණුම් පද්ධතිය, නිෂ්පාදන හා වියදම් යන දෙඅංශයෙන්ම තවදුරටත් වැඩිදියුණු කිරීමට 1992 දී මහ බැංකුව විසින් පියවර ගනු ලැබීය. රටේ ජාතික ගිණුම් ඇස්තමේන්තු වැඩිදියුණු කිරීම අරභයා ද්විතියික මූලාශ්‍රයන්ගෙන් දත්ත රැස්කිරීමට අමතරව බැංකුව විසින් ප්‍රාථමික මූලාශ්‍රයන්ගෙන් දත්ත රැස්කිරීමේ කටයුතු වල නිරත වූ අතර, හැකි හැම අවස්ථාවකදීම එම දත්ත කාර්තු පදනමක් මත රැස්කිරීමට යෙදුණි.

## ආනයන සුපරීක්ෂණය

මුළු ආනයන හා එහි සංයුතිය පිළිබඳව පූර්ව දර්ශකයක් ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන බැංකුව විසින් වාණිජ බැංකු මඟින් ලැබෙන ණයවර ලිපි සහ ණයවර ලිපි වලට අදාල වන බිල්පත්‍ර පදනම් කරගෙන එකතු කරගත් දත්ත මඟින් රටෙහි ආනයන පිළිබඳ සුපරීක්ෂණය කිරීම දිගටම සිදුකරනු ලැබීය.

## සේවා නියුක්ත සංඛ්‍යා

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව වූ වාර්ෂික සමීක්ෂණය 1992 දී ද පවත්වනු ලැබීය. මෙම සමීක්ෂණයේ අරමුණ වනුයේ රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ සංස්ථාඅංශයෙහි වූ සේවා නියුක්තියෙහි උපනතීන් විමසා බැලීමයි. මේ අතර, සංවිධිත පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තියේ උපනතීන් අධ්‍යයනය කරනු වස් සේවක අර්ථසාධක අරමුදල සහ වෙනත් අර්ථසාධක අරමුදල් වලට අදාල පරිපාලන වාර්තාවන්හි දත්ත යොදාගනු ලැබීය.

## දත්ත සැකසුම්

බැංකුව විසින් එයට අයත් ප්‍රධාන පරිගණකය මගින් අති විශාල දත්ත ප්‍රමාණයක් පරිගණක ගත කිරීම අඛණ්ඩව කරගෙන යන ලදී මෙම දත්තයන්ගෙන් වැඩි ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට අයත් දත්තයන් විය. 1992 වසරේ ආරම්භකරන ලද ප්‍රධාන කාර්යයක් වූයේ මහ බැංකුව විසින් පවත්වන ලද "දිළිඳු ජනකොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කෙරෙන ණය අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය" මගින් රැස්කරන ලද දත්ත සකස් කිරීමය" මහා පරිගණකයේ මධ්‍යම සැකසුම් ඒකකයේ කාලය හා මුද්‍රණකාලය යන දෙකම ඇතුලත්ව 1992 වර්ෂයේ මුළු උපයෝජන පරිගණක පැය ප්‍රමාණය 3618 ක් වූ අතර එය ඉකුත් වසරේ උපයෝජනය වූ පැය 3577 ට වඩා සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි.

## පුහුණු කිරීම්

අධ්‍යාපනික හා අධ්‍යාපනික නොවන ක්ෂේත්‍රවල නිලධාරීන් පුහුණු කිරීම, 1992 වර්ෂය තුලදී ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. අධ්‍යාපනික පුහුණුවීම් යටතේ විදේශ රටවල පිළිගත් විශ්ව විද්‍යාලයන්හි ආර්ථික විද්‍යාව හා අදාළ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයනයන් කිරීමට කටයුතු සලස්වන ලදී. ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි ප්‍රමුඛ පාඨමාලා මීට ඇතුලත්විය. පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා 1992/93 වර්ෂය සඳහා නිලධාරීන් 18 දෙනෙක් ද, 1993/94 වර්ෂය සඳහා 5 දෙනෙක් ද නාම යෝජනා කරන ලදී. මෙම නිලධාරීන්ගෙන් 8 දෙනෙක් 1992 අප්‍රේල් මාසයේ ද, 10 දෙනෙක් ජූනි මාසයේ ද 5 දෙනක් නොවැම්බර් මාසයේ ද නාමයෝජනා කරනු ලැබුවෝ වෙති. ඔවුන්ගෙන් නිලධාරීන් 15 දෙනෙක් 1992 දෙසැම්බර් මාසය වන විට පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා එතෙර ගොස් ඇත. ආචාර්ය උපාධිය සඳහා එක් නිලධාරියෙක් එතෙර ගියේය.

බැංකුවට වැදගත්වන විශේෂිත ක්ෂේත්‍රයන්ට අදාළවන දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩ මුළු සහ අධ්‍යාපනික චාරිකා, අධ්‍යාපනික නොවන පුහුණු කිරීම්වලට ඇතුළත් විය. 1992 වර්ෂය තුලදී නිලධාරීහු 68 දෙනෙක් කෙටිකාලීන පුහුණුවීම් සඳහා එතෙර ගියහ. නිලධාරීන් 143 දෙනෙක් ශ්‍රී ලංකාවේ විවිධ ආයතන මගින් පවත්වන ලද පුහුණු පාඨමාලාවන්ට හා සම්මන්ත්‍රණ ආදියට සහභාගිවූ අතර නිලධාරීන් 201 දෙනෙක් ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පාඨමාලාවන්ට සහභාගි විය.

පශ්චාත් උපාධි පුහුණුවීම් සඳහා විදේශගත වීමට අදහස් කරන නිලධාරීන් වෙනුවෙන් ආර්ථික විද්‍යාව හා ගණිතය පිළිබඳ පංති, බැංකුව මගින් පවත්වන ලදී. පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක්, බ්‍රිතාන්‍ය මණ්ඩලයේ භාෂා මධ්‍යස්ථානයේ පැවැත්වීමට එම මණ්ඩලය සමග අවශ්‍ය විධිවිධාන සලස්වන ලදී.

ශිල්පීය හා මාණ්ඩලික නොවන ශ්‍රේණිවල නියුතු නිලධාරීන් උසස් කිරීමේ පරීක්ෂණ, මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් කරගෙන ගිය අතර, පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබාගැනීමේ පරීක්ෂණයක් ද පවත්වන ලදී.

## කළමනාකාරිත්ව විගණන

සිය වැඩසටහන්වලට අනුකූලව කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් 1992 වසර තුළදී මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවල විගණන කාර්යයන්හි නිතර විය. තවද, එම කාලපරිච්ඡේදය තුළදී දෙපාර්තමේන්තුව මගින් මාතර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ කටයුතු පිළිබඳ සපිරි විගණනයක්ද, අනුරාධපුර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ කටයුතු පිළිබඳ විමර්ශනාත්මක විගණනයක්ද නිම කරන ලදී.

මෙම විගණනයන්හිදී මහ බැංකුවේ ලිඛිත අණපනත් හා රෙගුලාසි නියමිත පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න සොයා බලන ලදුව, ඒවා උල්ලංඝණය වූ අවස්ථාවන් පෙන්වා දීමට ද උත්සුක විය.

විගණන කාර්යයන්ට අමතරව විමසුමට ලක්වන කාලපරිච්ඡේදය තුලදී බැංකුවේ කළමනාකරණයට අදාල විෂයයන් පිළිබඳ වැදගත් අධ්‍යයන සහ සමීක්ෂණ කිහිපයක් ද පවත්වන ලදී. මේ අධ්‍යයනයන්ට මහ බැංකුවේ ඡායා පිටපත් යන්ත්‍ර භාවිතය, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ වැඩ අධ්‍යයනය, සුළු සේවක නිල ඇඳුම් සමීක්ෂණය, මහ බැංකුවේ පෞද්ගලික පරිගණක යන්ත්‍ර භාවිතය, මහ බැංකුවේ විදුලි බලය, ජලය සහ ඉන්ධන භාවිතය හා දුරකථන බිල්පත්වලට අදාල මාසික වියදම් පිළිබඳ අධ්‍යයනය, මහ බැංකු ගොඩනැගිල්ලේ ගිනි උපද්‍රව්‍ය හා පවිත්‍රතාවය පිළිබඳ අධ්‍යයනය, මහ බැංකුවේ සුළු සේවක,මාණ්ඩලික නොවන හා මාණ්ඩලික ශ්‍රේණිවලට අදාලව සිටින සේවක සංඛ්‍යා පිළිබඳ විවරණය කිරීම සහ, මහ බැංකුවට අයත් මෝටර් රථ පිළිබඳ සමීක්ෂණය, ඇතුළත් විය.

## පරිශ්‍ර

සාමාන්‍ය නඩත්තු කිරීමේ කටයුතු සහ මහ බැංකු පරිශ්‍රය උසස් මට්ටමකින් පවත්වාගෙන යෑමට අමතරව, වර්ෂය තුළදී පහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

1. නුවරඑළිය

(අ) 1991 නොවැම්බර් මස ආරම්භ කරන ලද නුවරඑළිය ද්විත්ව සංචාරක බංගලාවේ ඉදිකිරීම් කටයුතු 1992 අප්‍රේල් මස නිම කරන ලදී. මෙම සංචාරක බංගලාව බැංකු කාර්ය මණ්ඩලයේ නිවාඩු නිකේතනයක් වශයෙන් පාවිච්චි කරනු ලැබේ.

(ආ) 1992 වසර තුළදී ඉදිවෙමින් පැවති තට්ටුනිවාස 15 කින් සමන්විත නිවාඩු නිකේතනය 1993 අප්‍රේල් මාසය වන විට ප්‍රයෝජනයට ගැනීම සඳහා සූදානම් කිරීමට නියමිතය.

2. මහනුවර

පසුගිය වසර තුළ මහනුවර සංචාරක බංගලාවේ ඉදිකිරීම් කටයුතු සාර්ථක ලෙස කරගෙන යන ලදී. 1992 වර්ෂය අවසානයේදී ඉදිකිරීම් කටයුතු වලින් සියයට 90ක් අවසන් කරන ලද අතර, ඉතිරි වැඩකටයුතු 1993 අප්‍රේල් මස අවසන් වන විට නිම කිරීමට අපේක්ෂාකෙරේ.

3. රාජගිරිය

1991 දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද වැඩපොලේ ඉදිකිරීම් කටයුතු 1992 මාර්තු මස නිම කරන ලදී. වැඩපලට යාබද නව දෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කල්දමන ලදී.

4. කතරගම

මහ බැංකු සේවකයන් සඳහා සංචාරක බංගලාවක් / විශ්‍රාම ශාලාවක් සහ මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා කාර්යාලයක් සඳහා ඉදිකිරීම් කටයුතු 1992 මාර්තු මාසයේදී ආරම්භ කරන ලදී. නිදන කාමර 3 කින් යුත් සංචාරක බංගලාවේ ඉදිකිරීම් කටයුතු වලින් සියයට 90 ක් 1992 අවසානයේදී නිම කරන ලදී. නිදන යුගල කාමර 2 බැගින් සමන්විත වූ ඒකක 3 කින් යුත් විශ්‍රාම ශාලාව 1993 ප්‍රථම භාගය අවසන් වීමට පෙර නිම කිරීමට අපේක්ෂාකෙරේ. වර්ග අඩි 1900 කින් යුත් මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ, ශාඛා කාර්යාලය එම පරිශ්‍රය තුළම ඉදි කරගෙන යන අතර, 1993 වසර තුළදී එය නිම කිරීමට අපේක්ෂිත ය.

5. බහු මහල් රථවාහන නැවතුම්පොල

1990 මාර්තු මස ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද බහු මහල් මෝටර් රථ නැවතුම්පොල 1992 මාර්තු මාසයේ දී නිම කරන ලදී. ශ්‍රී ලංකාවේ මුල්ම වරට ඉදිකරන ලද මෙම වර්ගයේ මෝටර් රථ නැවතුම්පොල මහ බැංකුවේ ශිල්පීය කාර්‍ය මණ්ඩලය විසින් සැලසුම් කොට කොන්ත්‍රාත් පදනමක් මත පිටතින් ලබාගත් කම්කරුවන් ලවා රුපියල් දශ ලක්ෂ 10ක පමණ වියදමකින් ඉදිකරන ලදී.

## සුභ සාධන

මහ බැංකුව විසින් ස්වකීය සේවකයන් සඳහා පහත සඳහන් සුභසාධන පහසුකම් තවදුරටත් ප්‍රදානය කරන ලදී.

1. නිවාස ණය ක්‍රමය
2. කාර්ය මණ්ඩල සුභසාධන ක්‍රමය
3. වාහන ණය ක්‍රමය
4. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය
5. අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය

නිවාස හා වාහන ණය ක්‍රමයන් යටතේ ණය හිමිකම් සහ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ප්‍රතිලාභයන් 1992 දී වැඩි කෙරුණි.

මහ බැංකු ආපනශාලාව උදය සහ දවල් ආහාර වේල පිරිවැය මිළටම සේවකයන්ට ලබා දීම කර ගෙන ගියේය. මහබැංකුවේ සියළුම දෙපාර්තමේන්තුවල සියළුම නිලධාරින්ට උදය සහ සවස තේ පැන් බෙදා හරිනු ලැබීය. තවද නිල උත්සවයන් සඳහා ආහාරපාන සැපැයීමේ සේවය ද ආපනශාලාව මගින් ඉටුකරනු ලැබීය.

බැංකු චිකිත්සාගාරයෙහි සෑම වැඩ කරන දිනයකදීම කාර්යාල වේලාවන් තුල පූර්ණ කාලීනව සේවයෙහි නියුක්තව සිටින වෛද්‍යවරයකු සිටී. මීට අමතරව බැංකු චිකිත්සාගාරයට සම්බන්ධව ඖෂධාගාරයක් හා වෛද්‍ය පරීක්ෂණාගාරයක් ද ඇත.

## කාර්ය මණ්ඩල පුවත්

1992 ජුනි 30 වෙනි දින දක්වා අධිපති ආචාර්ය එච්.එන්.එස්. කරුණාතිලක මහතා පහත සඳහන් සම්මේලන හා රැස්වීම්වලට සහභාගිවිය.

(1) මලයාසියාවේ, ක්වාලාලම්පූර්හි පැවති 27 වෙනි 'සියැසන්' අධිපති වරුන්ගේ සම්මේලනය.

(2) නේපාලයේ කත්මන්ඩු නුවර පැවති ආසියානු නිශ්කාශන සංගමයේ 30 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම.

(3) එක්සත් රාජධානියේ ලන්ඩන්හි පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මේලනය සහ ස්විට්සර්ලන්තයේ බාස්ලේ හි පැවති ජාත්‍යන්තර නිශ්කාශන බැංකුවේ වාර්ෂික රැස්වීම.

ආචාර්ය එස්. එන්. එස්. කරුණාතිලක මහතා ගෙන් පසුව 1992 ජුලි මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු අධිපති වශයෙන් පත්වූ එච්.බී. දිසානායක මහතා, ජපානයේ ටෝකියෝහි පැවති 19 වැනි සියැන්සා මහ බැංකු පාඨමාලාවේ අධිපතිවරුන්ගේ සම්මේලනයට සහභාගිවූ අතර, ඉන්දුනීසියානු මහ බැංකුවේ අධිපති තුමා හමුවීමට ජාකර්තා බලා පිටත්විය.

අධිපති ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි අවස්ථාවන් හිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කරනු ලැබූ නියෝජ්‍ය අධිපති ආචාර්ය එස්.ටී.ජී. ප්‍රනාන්දු මහතා මහබැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ මුදල් මණ්ඩලයේ සභාපති වරයා වශයෙන් කටයුතු කරන ලදී.

**පත්වීම්**

වැඩබලන අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී ඩබ්ලිව්. ඒ. විජේවර්ධන මහතා 1991 ඔක්තෝබර් 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ එස්. රූපසිංහ මහතා 1992 පෙබරවාරි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය රාජ්‍ය ණය අධිකාරී ඩබ්ලිව්. එස්. එල්. ප්‍රනාන්දු මහතා 1992 පෙබරවාරි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක රාජ්‍ය ණය අධිකාරී වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය ග්‍රාමීය ණය අධ්‍යක්ෂ එම්.එන්.ආර්. කුරේ මිය 1992 පෙබරවාරි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක බැංකු සංවර්ධන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

නියෝජ්‍ය ව්‍යවහාර මුදල් අධිකාරී සී.කේ. පරණවිතාන මහතා 1992 පෙබරවාරි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන් පත් කරන ලදී.

පරිශ්‍ර අධ්‍යක්ෂ ජී.ඒ. පෙරේරා මහතා 1992 මැයි 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන ආරක්ෂක සේවා අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මහතා 1992 ජුලි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ජේ.ටී.ඩී. කරුණාරත්න මහතා 1992 ජුලි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

අධිපතිගේ පර්යේෂණ ඒකකයට අනුයුක්තව සිටි ආචාර්ය ඒ.සී.රන්දෙනි මහතා 1992 ජුලි 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ණය අධිකාරී හා රාජ්‍ය ණය ලේඛකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

උපදේශක පී.එම්.පී.ඩී. ද සිල්වා මහතා 1992 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන ලදී.

ආචාර්ය එල්.ටී.එන්. ප්‍රනාන්දු මහතා 1992 අගොස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන ලදී.

පී.එම්. නාගහවත්ත මහතා 1992 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන ලදී.

වැඩබලන අතිරේක ලේකම් එච්.ඒ.ජී. හෙට්ටිආරච්චි මහතා 1992 අගෝස්තු 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන ආයතන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

වැඩබලන අතිරේක කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ එස්. රූපසිංහ මහතා 1992 අගෝස්තු 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ආයතන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ටී.එස්.එන්. ප්‍රනාන්දු මහතා 1992 ඔක්තෝබර් 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සංවර්ධන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

බැංකු සංවර්ධන අධ්‍යක්ෂ සී.ටී.ජයසූරිය මහතා 1992 ඔක්තෝබර් 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලේකම් වශයෙන් පත් කරන ලදී.

පුහුණු වැඩ කටයුතු අධ්‍යක්ෂ ටී.ජී. සෞන්දනායගම් මහතා 1992 දෙසැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන මුදල් අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

වැඩබලන අතිරේක ආයතන අධ්‍යක්ෂ එස්. රූපසිංහ මහතා 1992 දෙසැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන පරිශ්‍ර අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

වැඩබලන අතිරේක රාජ්‍ය ණය අධිකාරී ඩබ්ලිව්. එස්. එල්. ප්‍රනාන්දු මහතා 1992 දෙසැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ග්‍රාමීය ණය අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

අතිරේක සුභසාධන අධ්‍යක්ෂ ටී.එච්.ඩී. පීරිස් මහතා 1992 දෙසැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි සුභසාධන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

සුභසාධන අධ්‍යක්ෂ එස්. පට්ටිවිදාන මහතා 1992 දෙසැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුහුණු වැඩ කටයුතු අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

පරිශ්‍ර අධ්‍යක්ෂ හා වැඩබලන ආරක්ෂක සේවා අධ්‍යක්ෂ ජී.ඒ.පෙරේරා මහතා 1992 දෙසැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආරක්ෂක සේවා අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

**මුදාහරිනු ලැබ සිටි නිලධාරීන් (1992 දෙසැම්බර් මස 31 වැනි දිනට)**

පහත නම් සඳහන් බැංකු නිලධාරීහු අමාත්‍යාංශවල, රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථාවල සහ ජාත්‍යන්තර ආයතනයන්හි තනතුරු සඳහා මුදාහරිනු ලැබ සිටියහ.

ඒ. එස්. ජයවර්ධන මහතා ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා කාර්මාන්ත විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත.

ආචාර්ය එල්.ටී.එන්. ප්‍රනාන්දු මහතා බංගලාදේශය, භූතානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

එන්.ජී. ධර්මබන්දු මහතා අධිපතිගේ උපදේශක වශයෙන් කටයුතු කිරීම සඳහා මියන්මාර් මහ බැංකුව වෙත.

ආචාර්ය ආර්. ජයමහ මහත්මිය ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා මුදල් හා බැංකු පිළිබඳ ජනාධිපති කොමිසම වෙත.

සී. ලියනගේ මහතා ඩබ්ලිව්.ඒ.ඩී. වීරසිංහ මහතා, එන්.එම්. දයාරත්න මහතා, එල්.ඒ. මහේන්ද්‍රන් මහතා, කේ.එම්. අබේකෝන් මහතා, ටී.ඩබ්ලිව්. ආරියරත්න මහතා සහ කේ. සරවනමුත්තු මෙනවිය මුදල් අමාත්‍යාංශය වෙත.

එස්.එම්.ඒ. සිරිවර්ධන මහතා දිස්ත්‍රික් ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී ලෙස කටයුතු කිරීම සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයෙහි සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වූ ණය ව්‍යාපෘතිය වෙත.

ඩී.බී. ජයසූරිය මහතා අග්‍රාමාත්‍යතුමාගේ කාර්යාලය වෙත.

**විශ්‍රාම ගැනීම් / ඉල්ලා අස්වීම්**

විධායක අධ්‍යක්ෂ එස්.ඩබ්ලිව්.පී. අමරසූරිය මහතා 1992 ජුලි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

ලේකම් ඩබ්ලිව්. ජයසේන මහතා 1992 ඔක්තෝබර් 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

ආයතන අධ්‍යක්ෂ කේ.ජී. ධර්මසේන මහතා 1992 නොවැම්බර් 28 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.